# සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

**ජාතික තරඟකාරී ලංසු කැඳවීම යටතේ**

# *පිරිසිදු කිරීමේ සේවය සැපයීම*

# *2026/2029*

## ලංසු ලියවිලි

## ක්ෂයරෝග මර්දන හා ළයරෝග පිළිබඳ ජාතික වැඩසටහන

**ප්‍රසම්පාදන අංකය – NPTCCD/CLE/2026-2029/02**

සියළුම ලේඛන අනු අංක පිළිවෙළට ඇති බවට පරීක්ෂා කර බලා ලබා ගත යුතු වේ.

***ක්ෂය රෝග මර්දන හා ළයරෝග පිළිබඳ ජාතික වැඩසටහන,***

***555/5, ඇල්විටිගල මාවත, නාරාහේන්පිට. කොළඹ 05***

## I කොටස. ලංසුකරුවන් සඳහා වන උපදෙස් (ITB)

ලංසුකරුවන් සඳහා වන උපදෙස් (ITB), II කොටස යටතේ ඇති ලංසු දත්ත පත්‍රිකාව (BDS) සමඟ ඒකාබද්ධව කියවිය යුතු වේ. ලංසු දත්ත පත්‍රිකාව (BDS) ලංසුකරුවන් සඳහා වන උපදෙස් (ITB)ට වඩා වැදගත් වන්නේය.

**පොදු කරුණු**

1. **ලංසු විෂය පථය**

1.1. ලංසු දත්ත පත්‍රිකාවේ (BDS) දක්වා ඇති සේවායෝජකයා විසින් මෙම ලංසු ලියවිල්ලෙහි IV කොටස යටතේ ඇති අවශ්‍යතා උපලේඛනය හි දක්වා ඇති පරිදි අදාළ සේවා සැපයීම සඳහා ලංසු ලියවිලි නිකුත් කරනු ලැබේ. මෙම ප්‍රසම්පාදනයේ නම, අංකය සහ කොටස් ගණන ලංසු දත්ත පත්‍රිකාවෙහි (BDS) දක්වා ඇත.

1.2. මෙම ලංසු ලේඛනය පුරා:

(අ) "ලිඛිතව" යන යෙදුමෙන් අදහස් වන්නේ තැපෑලෙන් (විද්‍යුත් තැපෑලෙන් හැර) ලිඛිතව ( භාර ගත් බවට සහතික කිරීමත් සමඟ) සන්නිවේදනය කිරීම වේ.

(ආ සන්ධභර්යට අවශ්‍ය නම් ‘‘තනි’’ යන්නෙන් ‘‘බහු’’ හා ප්‍රතිවිරුද්ධව යන්න අදහස් කෙරේ.

(ඇ) "දවස" යනුවෙන් දින දශර්න දිනය අදහස් කෙරේ.

2. **අරමුදල් මූලාශ්‍රය**

1.1. මෙම කොන්ත්‍රාත්තුව යටතේ ගෙවීම් සඳහා BDS හි නිශ්චිතව දක්වා ඇති මූලාශ්‍රය මගින් මුදල් සපයනු ලැබේ.

3. **ආචාර ධමර්, වංචා සහ දූෂණ**

3.1 ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව විසින් ප්‍රකාශයට පත් කරන ලද ප්‍රසම්පාදන මාර් ගොපදේශවල පහත කාරණා වෙත ලංසුකරුවන්ගේ අවධානය යොමු කෙරේ.

• ප්‍රසම්පාදන ක්‍රියාවන් හා සම්බන්ධ සියළුම පාශර්වයන් එනම් සැපයුම්කරුවන් / කොන්ත්‍රාත්කරුවන් සහ නිලධරයන් විසින් මෙම ක්‍රියාවලිය තුළදී තදින්ම රහස්‍යභාවය රැක ගන්නා බවට ඔවුන් සහතික විය යුතුය.

• ප්‍රසම්පාදන ක්‍රියාවක නියැලී සිටින නිලධරයන් තම බලතල අනිසි ලෙස පාවිච්චි නොකළ යුතුය. තමාට හෝ තමාගේ ළඟම පවුලේ සාමාජිකයන්ට හෝ ව්‍යාපාරික පාශර්වකරුවන්ට ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලියකදී තම තත්වය අනිසි ලෙස පාවිච්චි කරන යම් නිලධරයෙකු දූෂණ ක්‍රියාවල නියලී සිටින බවට සලකනු ලැබේ.

3.2 සේවායෝජකයා විසින් ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී හා කොන්ත්‍රාත් ක්‍රියාත්මක කිරීමේදී ලංසුකරුවන්, සැපයුම්කරුවන්, කොන්ත්‍රාත්කරුවන් සහ උපදේශකයින් විසින් ඉහළම ආචාර ධමර් පිළිපැදීම අවශ්‍ය බව දැනුවත් කළ යුතුය. මෙම ප්‍රතිපත්තිය අනුගමනය කිරීමේදී,

(අ) ‘‘දූෂිත ක්‍රියාව’’ යන්නෙන් අදහස් වන්නේ ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී හෝ කොන්ත්‍රාත් ක්‍රියාත්මක කිරීමේදී රාජ්‍ය නිලධාරීන්ගේ ක්‍රියාවට බලපෑම් කිරීම සඳහා වටිනා යම් කිසිවක් ඍජුව හෝ වක්‍රව පිරිනැමීම, ලබා ගැනීම හෝ ඉල්ලීමයි.

(ආ) "වංචා පිළිවෙත" යන්නෙන් අදහස් වන්නේ ප්‍රසම්පාදන ක්‍රියාවලියකට හෝ කොන්ත්‍රාත්තුවක් ක්‍රියාත්මක කිරීමට බලපෑම් කිරීම සඳහා කරුණු වැරදි ලෙස නිරූපණය කිරීම හෝ මග හැරීමයි.

(ඇ) "කුමන්ත්‍රණකාරී පිළිවෙත" යන්නෙන් අදහස් වන්නේ, කෘතිම හෝ තරඟකාරී නොවන මට්ටම් වල ලංසු මිල ස්ථාපිත කිරීම සඳහා සේවායෝජකයාගේ අනුදැනුම ඇතිව හෝ නැතිව ලංසුකරුවන් දෙදෙනෙකු හෝ වැඩි ගණනක් අතර වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම.

(ඇ) "බලහත්කාරී පිළිවෙත" යනු ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා සහභාගීත්වයට බලපෑම් කිරීම හෝ කොන්ත්‍රාත්තුවක් ක්‍රියාත්මක කිරීමට බලපෑම් කිරීම සඳහා පුද්ගලයන්ට හෝ ඔවුන්ගේ දේපළවලට ඍජුව හෝ වක්‍රව තර්ජනය කිරීම හෝ හානි කිරීමය.

3.3 ITB වගන්තිය 3.2 යටතේ නියම කර ඇති පරිදි, ලංසුකරුවෙකු ඍජුව හෝ නියෝජිතයෙකු මාගර්යෙන් දූෂිත, වංචනික, කුමන්ත්‍රණකාරී හෝ බලහත්කාර ක්‍රියාකාරකම්වල නියැලී සිටින බව අනාවරණය වුවහොත්, සේවායෝජකයා විසින් ලංසුව ප්‍රතික්ෂේප කරනු ඇත.

**4. සුදුසුකම්ලත් ලංසුකරුවන්**

4.1 මෙම කොන්ත්‍රාත්තුව යටතේ සේවා සැපයීම සඳහා සියලුම ලංසුකරුවන්ට නීත්‍යානුකූල අයිතිය ඇත.

4.2 ලංසු තබන්නෙකුට සම්බන්ධතා අතර අනුකූලතාව නොතිබිය යුතුය. සම්බන්ධතා අතර අනුකූලතාවයක් ඇති බව සොයා ගන්නා ලද සියලුම ලංසුකරුවන් නුසුදුස්සන් කරනු ලැබේ. පහත සඳහන් අවස්ථාවලදී ලංසුකරුවන්ට ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළ එක් පාශර්වයක් හෝ කිහිපයක් සමඟ සම්බන්ධතා අතර අනුකූලතාවයක් ඇති බව සැලකිය හැකිය,ඒවා නම්:

(අ) ප්‍රසම්පාදනය සඳහා භාවිතා කළ යුතු සැලසුම්, පිරිවිතර ලංසු ලියවිලි සහ වෙනත් ලියකියවිලි සකස් කිරීම සඳහා උපදේශන සේවා සැපයීම සඳහා සේවායෝජකයා විසින් නියැලී සිටින සමාගමක් හෝ එහි අනුබද්ධ ආයතනයක් සමඟ සම්බන්ධ වීම හෝ සම්බන්ධ වී තිබීම හෝ

(ආ) මෙම ලංසු තැබීමේ ක්‍රියාවලියේදී ලංසු එකකට වඩා ඉදිරිපත් කිරීම. නමුත් මෙය එක් ලංසුවකට වඩා උප කොන්ත්‍රාත්කරුවන්ගේ සහභාගීත්වය සීමා නොකරයි.

4.3 ලංසු ඉදිරිපත් කරන දිනයේ හෝ කොන්ත්‍රාත් ප්‍රදානය කරන දිනයේදී මුදල් අමාත්‍යාංශය විසින් හෝ සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් අසාධු ලේඛනගත කර ඇති ලංසුකරුවන් නුසුදුස්සන් වනු ඇත.

4.4 විදේශීය ලංසුකරුට ලංසුවක් ඉදිරිපත් කළ හැක්කේ ලංසු දත්ත සටහනේ එසේ සඳහන් කර ඇත්නම් පමණි.

**5. ලංසු තැබීමේ පිරිවැය**

5.1 ලංසුකරු තම ලංසුව සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධව සියලු වියදම් දැරිය යුතු අතර, සේවා යෝජකයා කිසිදු අවස්ථාවක එම වියදම් සඳහා වගකිවයුතු හෝ වගකිවයුතු නොවේ.

**6. පූවර් ලංසු රැස්වීම**

6.1 ලංසුකරුට සේවය සැපයීම අවශ්‍ය වන ස්ථානය පරීක්ෂා කිරීමට හා ලංසුව සකස් කිරීමට අවශ්‍ය සියලු තොරතුරු සපයා ගැනීම සඳහාත් පූර් ව ලංසු කැඳවීම පවත්වනු ලැබේ. පූර් ව ලංසු රැස්වීම සඳහා සහභාගී වීමේ පිරිවැය ලංසුකරු විසින් දැරිය යුතු වේ.

පූවර් ලංසු රැස්වීම පැවැත්වීම පහත පරිදි කාල සටහන් කර ඇත.

ස්ථානය : ක්‍ෂය රෝග මර් දන හා ළයරෝග පිළිබඳ ජාතික වැඩසටහන, 555/5, ඇල්විටිගල මාවත,

නාරාහේන්පිට. කොළඹ 05

දිනය : 2026-04-09

## ලංසු ලේඛනවල අන්තගර්තය

### 7. ලංසු ලේඛනයේ කොටස්

7.1 ලංසු ලේඛනයට පහත දක්වා ඇති කොටස් ඇතුළත් වන අතර "ලංසුකරුවන් සඳහා වන උපදෙස්" හි 8 වැනි වගන්තිය අනුව නිකුත් කරන ලද ඕනෑම සංශෝධිත ඇමුණුමක් සමඟ ඒකාබද්ධව කියවිය යුතුය.

- I කොටස - ලංසුකරුවන් සඳහා වන උපදෙස් (ITB)
- II කොටස - ලංසු දත්ත පත්‍රිකාව (BDS)
- III කොටස - ලංසු ආකෘති පත්‍ර
- IV වගන්තිය - අවශ්‍යතා උපලේඛනය
- V කොටස - කොන්ත්‍රාත්තුවේ කොන්දේසි (CC)
- VI කොටස - කොන්ත්‍රාත් දත්ත
- VII කොටස - කොන්ත්‍රාත් ආකෘති පත්‍ර
- ලංසු දැන්වීම

7.2 ලංසුකරු විසින් ලංසු ලේඛනවල ඇති සියලුම උපදෙස්, පෝරම, නියමයන් සහ පිරිවිතර පරීක්ෂා කිරීම බලාපොරොත්තු වේ. ලංසු ලේඛන මගින් අවශ්‍ය සියලුම තොරතුරු හෝ ලියකියවිලි සැපයීමට අපොහොසත් වීම ලංසුව ප්‍රතික්ෂේප වීමට හේතු විය හැක.

### 8. ලංසු ලේඛන පිළිබඳ පැහැදිලි කිරීම

8.1 ලංසු ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන ලංසුකරුවෙකු පිරිවිතරයන් සීමා කිරීම ඇතුළුව ලංසු ලේඛනවල කිසියම් පැහැදිලි කිරීමක් අපේක්ෂා කරන්නේ නම් "ලංසු දත්ත සටහනෙහි" නිශ්චිතව දක්වා ඇති සේවායෝජකයාගේ ලිපිනයට ලිඛිත විමසීමක් කළ යුතුය. ලංසු විවෘත කිරීමේ දිනයට දින දහයකට (10) පෙර එවැනි ඉල්ලීමක් ලැබෙන්නේ නම්, පැහැදිලි කිරීම සඳහා වන ඕනෑම ඉල්ලීමකට සේවායෝජකයා විසින් ලිඛිතව ප්‍රතිචාර දක්වයි. සේවායෝජකයා විසින් එම ප්‍රතිචාරයේ පිටපත් ලංසු ලේඛන මිලදී ගෙන ඇති සියලුම දෙනාට ලබා දිය යුතුය.පැහැදිලි කිරීමක ප්‍රතිඵලයක් ලෙස ලංසු ලේඛනය සංශෝධනය කිරීමට අවශ්‍ය යැයි සේවායෝජකයා සලකන්නේ නම්, එය "ලංසුකරුවන් සඳහා වන උපදෙස්හි " 9 වැනි වගන්තිය යටතේ දක්වා ඇති ක්‍රියා පටිපාටිය අනුගමනය කරමින් එසේ කළ යුතුය.

### 9. ලංසු ලේඛන සංශෝධනය කිරීම

9.1 ලංසු ඉදිරිපත් කිරීම සඳහා නියමිත කාලසීමාවට පෙර ඕනෑම අවස්ථාවක, සේවායෝජකයා විසින් සංශෝධිත ඇමුණුමක් (addendum) නිකුත් කිරීම මගින් ලංසු ලේඛන සංශෝධනය කළ හැක.

9.2 නිකුත් කරන ලද ඕනෑම සංශෝධිත ඇමුණුමක් (addendum) ලංසු ලේඛනවල කොටසක් වන අතර ඒ පිළිබඳව ලංසු ලේඛන මිල දී ගෙන ඇති සියල්ලන්ට ලිඛිතව දැනුම් දෙනු ලැබේ.

9.3 ලංසුකරුවන්ට සංශෝධිත ඇමුණුම අනුව ලංසු සකස් කිරීමට සාධාරණ කාලයක් ලබා දීම සඳහා, සේවායෝජකයාට තම අභිමතය පරිදි ITB 23.2 වැනි උප වගන්තියට අනුව ලංසු ඉදිරිපත් කිරීමේ කාලසීමාව දීඝර් කළ හැකිය.

## ලංසු සකස් කිරීම

### 10. ලංසු පිරිවැය

10.1 ලංසුකරු විසින් ලංසුව සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම හා සම්බන්ධ සියලු වියදම් දැරිය යුතු අතර, ලංසු ක්‍රියාදාමය හෝ එහි ප්‍රතිඵලය කුමක් වුවත් සේවායෝජකයා එම පිරිවැය සඳහා වගකීමක් දරන්නේ නැත.

### 11. ලංසු භාෂාව

11.1 ලංසුව, මෙන්ම ලංසුකරු සහ සේවායෝජකයා විසින් හුවමාරු කරන ලද ලංසුවට (ආධාරක ලේඛන සහ මුද්‍රිත ආකෘති) අදාළ සියලුම ලිපි සහ ලියකියවිලි සිංහල/දෙමළ/ඉංග්‍රීසි යන භාෂාවකින් විය යුතුය.

### 12. ලංසුවෙහි ඇතුළත් ලේඛන

12.1 ලංසුව සමඟ පහත සඳහන් ලේඛන අඩංගු විය යුතුය.

(අ) ITB වගන්ති 13, 15 සහ 16 අනුව ලංසු ඉදිරිපත් කිරීමේ පෝරමය සහ අදාළ මිල ගණන්

(ආ) ITB වගන්තිය 20 අනුව ලංසු සුරක්ෂණය හෝ ලංසු සුරක්ෂණ ප්‍රකාශය,

(ඇ) ITB වගන්ති 17, 18 සහ 29 අනුව සේවා සැපයීම ලංසු ලේඛනවලට අනුකූල වන බවට ලිඛිත සාක්ෂි

(ඇ) ලංසුව පිළිගනු ලැබුවහොත් කොන්ත්‍රාත්තුව ඉටු කිරීමට ලංසුකරුගේ සුදුසුකම් තහවුරු කරන ITB වගන්තිය 18 අනුව ලිඛිත සාක්ෂි,

(ඉ) BDS හි අවශ්‍ය බව දැක්වෙන අනෙකුත් ලියවිලි.

(ඊ) අංක 01 සිට 71 දක්වා අංකනය කර ඇති මුද්‍රිත ලේඛන වලින් අනතුරුව, ලංසුව සමඟ ඉදිරිපත් කරන ලේඛන එතැන් සිට ඉදිරියට අංක කල යුතුය. අනතුරුව, IV කොටස හි ඇමුණුම VI හි මූලික සුදුසුකම් පරීක්ෂාව සඳහා වූ ලේඛනයට නම් කර ඇති එක් එක් ආකෘතිය ඉදිරියේ අදාළ පිටු අංක සඳහන් කල යුතුය.

### 13. ලංසු ඉදිරිපත් කිරීමේ පෝරමය සහ මිල සටහන්

13.1 ලංසු ඉදිරිපත් කරන්නා විසින් ලංසු ඉදිරිපත් කිරීමේ පෝරමය වන III කොටසේ ඇතුළත් ලංසු අයදුම්පත්‍රය භාවිතා කර ඉදිරිපත් කළ යුතුය. මෙම පෝරමය එහි ආකෘතියේ කිසිදු වෙනසක් නොමැතිව සම්පූර්ණ කළ යුතු අතර, ආදේශක පිළිගනු නොලැබේ. අවශ්‍ය සියලුම තොරතුරු සැපයීම අනිවාර්ය වේ.

### 14. විකල්ප ලංසු

14.1 විකල්ප ලංසු සලකා බලනු නොලැබේ.

14.2 එක් අයදුම්කරුවෙකුට එක් ආයතනයක් වෙනුවෙන් ඉදිරිපත් කළ හැකි වනුයේ එක් ලංසුපතක් පමණි. එකම අධ්‍යක්ෂ මණ්ඩලයකින් හෝ අධ්‍යක්ෂ මණ්ඩලයේ හරි අඩකින් එක් ආයතනයකට ලංසු එකක් පමණක් අයදුම් කළ හැක. කුමන හෝ ආකාරයකින් එක් ආයතනයකට ලංසුපත් එකකට වඩා ඉදිරිපත් කොට තිබේ නම් එසේ ඔහු විසින් ඉදිරිපත් කරනු ලබන සියලුම ලංසු අවලංගු කිරීමට යටත් වේ.

### 15. ලංසු මිල සහ වට්ටම්

15.1 ලංසුකරු විසින් කොන්ත්‍රාත්තුව යටතේ සැපයීමට යෝජනා කරන සේවාවේ හා අදාළ උපකරණ මිල ගණන් සහ මුළු ලංසු මිල ගණන් මිල සටහනේ සඳහන් කළ යුතුය.

15.2 මිල සටහනේ ඕනෑම තනි භාණ්ඩයකට/සේවාවකට ලබා දෙන ඕනෑම වට්ටමක් භාණ්ඩයේ ඒකක මිලට ඇතුළත් කළ යුතුය. තවද ලංසුකරු විසින් ලංසුව සඳහා සම්පූර්  වට්ටමක් ලබා දෙන්නේ නම් ඒ පිළිබඳව මිල සටහනේ පැහැදිලිව සඳහන් කළ යුතුය.

15.3 ITB උප වගන්තිය 1.1 හි එසේ දක්වා තිබේ නම්, තනි කොටසක් සඳහා හෝ කොටස් කිහිපයකට (පැකේජ) සඳහා ලංසු කැඳවනු ලැබේ. BDS හි වෙනත් ආකාරයකින් දක්වා නොමැති නම්, උපුටා දක්වන ලද මිල ගණන් එක් එක් කොටස් සඳහා නිශ්චිතව දක්වා ඇති අයිතමවලින් 100% ට සහ එක් එක් කොටස සඳහා නිශ්චිතව දක්වා ඇති ප්‍රමාණවලින් 100% ට අනුරූප විය යුතුය. කොන්ත්‍රාත් එකකට වඩා ප්‍රදානය කිරීම සඳහා කිසියම් මිල අඩු කිරීමක් (වට්ටමක්) පිරිනැමීමට කැමති ලංසුකරුවන් අදාළ මිල අඩු කිරීම වෙන වෙනම සඳහන් කළ යුතුය.

15.4 (i) සපයනු ලබන සේවාවන්ට අදාළ මිල ගණන්

(ii) මිල සටහනේ දක්වා ඇති මිල ගණන්වලට උපයෝගී කර ගන්නා යම් භාණ්ඩයක් සඳහා සැපයුම්කරු විසින් දැනටමත් ගෙවා ඇති හෝ ගෙවිය යුතු සියලුම තීරුබදු සහ විකුණුම් සහ අනෙකුත් බදු ඇතුළත් විය යුතුය.

(iii) කෙසේ වෙතත්, වැට් බදු මිලට ඇතුළත් නොකළ යුතු නමුත් වෙන වෙනම සඳහන් කළ යුතුය.

15.5 ලංසුකරු විසින් උපුටා දක්වන ලද මිල ගණන් කොන්ත්‍රාත්තුව ආරම්භ කළ පසු කිසිදු අයුරකින් වෙනස් නොවිය යුතුය. ITB වගන්තිය 31 ට අනුව නිශ්චිතව දක්වා නොමැති මිල ගණන් සමඟ ඉදිරිපත් කරන ලද ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

15.6 සියලුම අයිතම සඳහා මිල උපලේඛන අනුව වෙන වෙනම ලැයිස්තුගත කර මිල ඉදිරිපත් කළ යුතුය. මිල උපලේඛනයක ලැයිස්තුගත කර ඇති නමුත් මිල ඉදිරිපත් කර නොමැති අයිතම පෙන්නුම් කරන්නේ නම්, ඒවායේ මිල ගණන් වෙනත් අයිතමවල මිලට ඇතුළත් වේ යැයි උපකල්පනය කළ යුතුය.

## 16. ලංසු මුදල්

16.1 ලංසු දත්ත පත්‍රිකාවේ වෙනත් ආකාරයකින් දක්වා නොමැති නම්, ලංසුකරු ශ්‍රී ලංකා රුපියල් වලින් මිල දැක්විය යුතු අතර ගෙවීම් කරනු ලබන්නේද ශ්‍රී ලංකා රුපියල් වලින් පමණි.

## 17. ලංසුකරුගේ යෝග්‍යතාව තහවුරු කරන ලියකියවිලි (Eligibility)

17.1 ITB 4 වන වගන්තිය අනුව ඔවුන්ගේ සුදුසුකම් තහවුරු කිරීම සඳහා, ලංසුකරුවන් විසින් III වන කොටසේ ලංසු ආකෘති පත්‍ර සම්පූර් ණ කළ යුතුය.

## 18. ලංසුකරුගේ සුදුසුකම් තහවුරු කරන ලියකියවිලි (Qualification)

18.1 සේවා සැපයීම ලංසු තැබීමේ ලියකියවිලි වලට අනුකූල බව තහවුරු කිරීම සඳහා ලංසුකරු විසින් IV වන කොටස යටතේ ඇති අවශ්‍යතා උපලේඛනයේ දක්වා ඇති ප්‍රමිතීන්ට අනුකූල බවට ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

18.2 ලංසුව පිළිගනු ලැබුවහොත්, කොන්ත්‍රාත්තුව ඉටු කිරීමට ලංසුකරුගේ සුදුසුකම් පිළිබඳ ලිඛිත සාක්ෂි සම්බන්ධයෙන් සේවායෝජකයා සෑහීමකට පත් විය යුතුය.

18.3 එක් ලංසුකරුවෙක් ආයතන කිහිපයකට ලංසු ඉදිරිපත් කරන්නේ නම් ඒ සඳහා ඉදිරිපත් කරනු ලබන ලියවිලිවල මුල් පිටපත එක් ලංසුවක් සමඟ ඉදිරිපත් කළ යුතු අතර එය කුමන ලංසුව සමඟ ඉදිරිපත් කර ඇත්ද යන්න අනෙක් ලංසුවල සඳහන් කළ යුතු වන අතර අනෙක් ලංසු සමඟ මුල් පිටපත්වල සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතුය.

## 19. ලංසු වලංගු කාලය

19.1 BDS හි නිශ්චිතව දක්වා ඇති දිනය දක්වා ලංසු වලංගු විය යුතුය. අඩු ලංසු කාලයක් සහිත ලංසු ප්‍රතිචාරාත්මක නොවන සේ සළකා ප්‍රතික්ෂේප කරනු ලැබේ.

19.2 අවශ්‍ය විටදී ලංසු වලංගු දිනය අවසන් වීමට පෙර, සේවායෝජකයා විසින් ලංසුකරුවන්ගෙන් ලංසු වල වලංගු කාලය දීර්ඝ කරන ලෙස ඉල්ලා සිටිය හැක. එම ඉල්ලීම් හා ප්‍රතිචාර ලිඛිතව විය යුතුය. ITB 20 වගන්තිය අනුව ලංසු සුරක්ෂණය ඉල්ලා සිටින්නේ නම්, එය වෙනස් කරන ලද කාල සීමාවක් සඳහා ද දීර්ඝ කළ යුතුය. යම් ලංසුකරුවෙකුට එම ඉල්ලීම ප්‍රතික්ෂේප කළ හැක. එම අවස්ථාවේදී ඔහුගේ ලංසු සුරක්ෂණය අහිමි නොකළ යුතුය. වලංගු කාලය දිගු කර දෙන ලංසුකරුවෙකුට ලංසුව වෙනස් කිරීමට අවසර ලබා නොදේ.

20. **ලංසු සුරක්ෂණය**

20.1 ලංසුකරු විසින් BDS හි නිශ්චිතව දක්වා ඇති පරිදි එහි ලංසුවේ කොටසක් වශයෙන් ලංසු සුරක්ෂණය හෝ ලංසු සුරක්ෂණ ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතුය.

20.2 ලංසු සුරක්ෂණය BDS හි නිශ්චිතව දක්වා ඇති පරිදි සහ ශ්‍රී ලංකා රුපියල් වලින් විය යුතු අතර,

(අ) ලංසුකරුගේ අභිමතය පරිදි, බැංකු කෙටුම්පතක්, ණයවර ලිපියක් හෝ බැංකු ආයතනයකින් බැංකු ඇපකරයක් ආකාරයෙන් විය යුතුය.

(ආ) III කොටස යටතේ ඇති ලංසු ආකෘති පත්‍රවලට අනුකූල විය යුතුය.

(ඇ) ITB වගන්තිය 20.5 හි ලැයිස්තුගත කර ඇති කොන්දේසි මත සේවායෝජකයාගේ ලිඛිත ඉල්ලීම් අනුව ගෙවිය යුතුය.

(ඉ) BDS හි නිශ්චිතව දක්වා ඇති කාල සීමාව සඳහා වලංගු විය යුතුය.

20.3 ITB උප වගන්තිය 20.1 සහ 20.2 හි දක්වා ඇති පරිදි ලංසු සුරක්ෂණය හෝ ලංසු සුරක්ෂණ ප්‍රකාශයක් නොමැති ලංසු සේවා යෝජකයා විසින් ප්‍රතිචාරාත්මක නොවන සේ සළකා ප්‍රතික්ෂේප කරනු ලැබේ.

20.4 ITB 42 වගන්තියට අනුව සාර්ථක ලංසුකරු විසින් කාර් යසාධන සුරක්ෂණය සැපයීමෙන් පසු අසාර් ථක ලංසුකරුවන්ගේ ලංසු සුරක්ෂණය ආපසු ලබා දෙනු ලැබේ.

20.5 පහත අවස්ථාවලදී ලංසු සුරක්ෂණය අහිමි වීම හෝ ලංසු සුරක්ෂණ ප්‍රකාශය අවසන් කිරීමට සිදු වේ.

(අ) ITB උපවගන්තිය 19.2 හි දක්වා ඇති පරිදි හැර, ලංසු ඉදිරිපත් කිරීමේ පෝරමයේ ලංසුකරු විසින් නිශ්චිතව දක්වා ඇති ලංසු වලංගු කාල සීමාව තුළ ලංසුකරුවෙකු තම ලංසුව ඉල්ලා අස්කර ගන්නේ නම්,

(ආ) ITB උප වගන්තිය 30.3 අනුව අංක ගණිතමය දෝෂ නිවැරදි කිරීමට ලංසුකරුවෙකු එකඟ නොවන්නේ නම්,

(ඇ) සාර්ථක ලංසුකරු විසින් පහත සඳහන් ක්‍රියාවන් කිරීමට අපොහොසත් වීම.

(i) ITB 41 වගන්තිය අනුව කොන්ත්‍රාත්තුව අත්සන් කිරීමට අපොහොසත් වීම

(ii) ITB 42 වගන්තිය අනුව කායර් සාධන සුරක්ෂණය සැපයීම නොහැකි වීම.

(ඈ) සාර්ථක ලංසුකරුට ලිඛිතව දැනුම් දුන් දින සිට දින 14ක් ඇතුළත එයට සාර්ථක ප්‍රතිචාර නොදක්වන ලද්දේ නම් ඊළඟ ලංසුකරුට කොන්ත්‍රාත්තුව ලබාදීම පිළිබඳව සළකා බැලීමට ප්‍රසම්පාදන කමිටුවට බලය ඇත. ලංසු ප්‍රදානය කිරීමෙන් පසුව සාධාරණ හේතු නොමැතිව එය භාරගැනීම ප්‍රතික්ෂේප කරන ලංසුකරුවන් අසාධු ලේඛනයට ඇතුළත් කිරීමට කටයුතු කරන අතර ලංසු සුරක්ෂණය ද රාජසන්තක කරනු ඇත.

## 21. ලංසු ආකෘතිය සහ අත්සන් කිරීම

21.1 ලංසුකරු විසින් ITB 12 වගන්තියේ විස්තර කර ඇති පරිදි ලංසුව ඇතුළත් ලේඛනවල මුල් පිටපතක් සකස් කර එය "මුල් පිටපත" ලෙස පැහැදිලිව සලකුණු කළ යුතුය. ඊට අමතරව, ලංසුකරු විසින් ලංසුවේ පිටපතක් ඉදිරිපත් කර එය "අනු පිටපත්" ලෙස පැහැදිලිව සලකුණු කළ යුතුය. මුල් පිටපත සහ අනු පිටපත අතර යම් විෂමතාවයක් ඇති වුවහොත්, මුල් පිටපත බලපැවැත්වේ.

21.2 ලංසුවේ මුල් පිටපත සහ අනු පිටපත නොමැකෙන තීන්තවලින් යතුරු ලියනය කර හෝ ලියා තිබිය යුතු අතර ලංසුකරු වෙනුවෙන් අත්සන් කිරීමට නිසි බලය ලත් තැනැත්තෙකු විසින් අත්සන් කළ යුතුය.

21.3 ඕනෑම අන්තර් සම්බන්ධක, මකාදැමීම් හෝ උඩින් ලිවීම වලංගු වනුයේ එතැන ලංසුව අත්සන් කළ පුද්ගලයාගේ අත්සන හෝ කෙටි අත්සන යෙදීමෙන් පමණි.

<u>**ලංසු ඉදිරිපත් කිරීම සහ විවෘත කිරීම.**</u>

## 22. ලංසු ඉදිරිපත් කිරීම, මුද්‍රා තැබීම සහ ලකුණු කිරීම

22.1 ලංසුකරුවන්ට සෑම විටම තැපෑලෙන් හෝ අතින් තම ලංසු ඉදිරිපත් කළ හැක.

(අ) තැපෑලෙන් හෝ අතින් ලංසු ඉදිරිපත් කරන ලංසුකරුවන් විසින් "මුල් පිටපත" සහ "අනු පිටපත" නිසි පරිදි සලකුණු කර වෙන් වෙන්ව ලිපි කවර වල මුද්‍රා තබා එම පිටපත් දෙක මුල් පිටපත හා අනු පිටපත ලෙස ලකුණු කර එක් ලියුම් කවරයක බහා එවිය යුතුය.

22.2 සියළු ලියුම් කවර (ඇතුළත සහ පිටත) පහත පරිදි සැකසිය යුතුය.

(අ) ලංසුකරුගේ නම සහ ලිපිනය සටහන් කිරීම.

(ආ) ITB උප වගන්තිය 23.1 අනුව සේවායෝජකයා වෙත යොමු කිරීම.

(ඇ) BDS හි දක්වා ඇති පරිදි මෙම ප්‍රසම්පාදනය නිශ්චිත වශයෙන් හඳුනා ගත හැකි විය යුතුයි.

(ඇ) ITB උප වගන්තිය 26.1 ට අනුව, ලංසු විවෘත කිරීමට නියමිත දින, නියමිත වේලාවට පෙර විවෘත නොකරන ලෙසට විශේෂ සටහනක් කිරීම.

සියලුම ලියුම් කවර මුද්‍රා තබා අවශ්‍ය පරිදි සලකුණු කර නොමැති නම්, ලංසුව අස්ථානගත වීම හෝ නියමිත දින නියමිත වේලාවට පෙර විවෘත කිරීම සම්බන්ධයෙන් සේවායෝජකයා විසින් කිසිදු වගකීමක් භාර නොගනී.

## 23. ලංසු ඉදිරිපත් කිරීමේ අවසාන දිනය

23.1 BDS හි නිශ්චිතව දක්වා ඇති ලිපිනයට, අදාළ දිනය සහ වේලාවට පෙර සේවායෝජකයා වෙත ලංසු ඉදිරිපත් කළ යුතුය.

23.2 ITB 9 වැනි වගන්තිය අනුව සේවායෝජකයාට ලංසු ඉදිරිපත් කිරීමේ කාලසීමාව දීඝර් කළ හැකිය, එහිදී සේවායෝජකයා සහ ලංසුකරුවන්ගේ සියලු බැඳීම් පෙර පරිදිම දීර්ඝ කරන ලද කාල සීමාව දක්වා වලංගු වේ.

## 24. ප්‍රමාද වූ ලංසු

24.1 ITB වගන්තිය 23 ට අනුව ලංසු ඉදිරිපත් කිරීම සඳහා නියමිත කාලසීමාවට පසුව පැමිණෙන කිසිදු ලංසුවක් සේවායෝජකයා විසින් සලකා බලනු නොලැබේ.

## 25. ලංසු ආපසු ගැනීම සහ වෙනස් කිරීම

25.1 ITB 22 වගන්තිය අනුව ඉදිරිපත් කළ ලංසුවක් ලංසුකරුවෙකුට ඉල්ලා අස්කර ගැනීමට හෝ වෙනස් කිරීමට හැකිය. ITB උප වගන්තිය 21.2 අනුව එම ඉල්ලීම ලංසුකරු හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකු විසින් නිසි පරිදි අත්සන් කරන ලද ලිඛිත ඉල්ලීමක් විය යුතුය.

එම සියලුම දැනුම්දීම් :

(අ) ITB වගන්ති 21 සහ 22 අනුව ඉදිරිපත් කළ යුතු අතර, අදාළ ලියුම් කවරවල ''ඉල්ලා අස්කර ගැනීම'' හෝ ''වෙනස් කිරීම'' යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය.

(ආ) ITB 23 වගන්තිය අනුව, ලංසු ඉදිරිපත් කිරීම සඳහා නියම කර ඇති අවසාන දිනයට හා වේලාවට පෙර සේවායෝජකයා වෙත ලබා දිය යුතු වේ.

25.2 ITB උප වගන්තිය 25.1 අනුව ඉල්ලා අස්කර ගන්නා ලෙස ඉල්ලා සිටින ලංසු 40 උප වගන්තිය අනුව සාථර්ක ලංසුකරුට කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම දැනුම් දීමෙන් පසුව පමණක් ලංසුකරුවන් වෙත ආපසු ලබා දිය යුතුය.

25.3 ලංසු ඉදිරිපත් කිරීමේ අවසාන දිනයේ සිට ලංසු වලංගු කාලය අවසන් වීම හෝ එහි යම් දිගුවක් ලබා දී තිබේ නම් එම කාලය තුල, ලංසුවක් ඉල්ලා අස්කර ගැනීම, ආදේශ කිරීම හෝ වෙනස් කිරීම නොකල යුතුය.

## 26. ලංසු විවෘත කිරීම.

26.1 BDS හි නිශ්චිතව දක්වා ඇති ලිපිනය, දිනය සහ වේලාවේදී සේවායෝජකයා විසින් ලංසු විවෘත කිරීම ප්‍රසිද්ධියේ සිදු කළ යුතුය. ලංසු විවෘත කිරීමේදි ලංසුකරු හෝ ලංසුකරු විසින් නම් කරන ලද නියෝජිතයකු ලංසු විවෘත කිරීමේ අවස්ථාව සඳහා සහභාගි විය හැක.

26.2 පළමුව, "ඉල්ලා අස්කර ගැනීම" ලෙස සලකුණු කර ඇති ලියුම් කවර විවෘත කර කියවිය යුතු අතර, සේවායෝජකයාගේ අභිමතය පරිදි අදාළ ලංසුව සහිත ලියුම් කවරය විවෘත කළ හැක. අදාළ , "ඉල්ලා අස්කර ගැනීම" දැන්වීම ලංසුකරු හෝ බලයලත් නියෝජිතයකු විසින් ලිඛිතව ඉදිරිපත් කල යුතු අතර , ලංසු විවෘත කිරීමේදී කියවා ඇත්නම් මිස ලංසු ආපසු ගැනීමකට අවසර නොදේ. "වෙනස් කිරීම" යනුවෙන් සලකුණු කර ඇති ලියුම් කවර විවෘත කර අදාළ ලංසුව සමඟ කියවිය යුතුය. අනුරූප වෙනස් කිරීමේ දැන්වීමේ වෙනස් කිරීම ඉල්ලා සිටීම සඳහා වලංගු අවසරයක් අඩංගු විය යුතු අතර එය ලංසු විවෘත කිරීමේදී කියවා ඇත්නම් මිස ලංසු වෙනස් කිරීමට අවසර නොදේ. ලංසු විවෘත කිරීමේදී විවෘත කර කියවන ලියුම් කවර පමණක් තවදුරටත් සලකා බලනු ලැබේ.

26.3 අනෙකුත් සියලුම ලියුම් කවර එකින් එක විවෘත කර කියවිය යුතුය. ලංසුකරුගේ නම සහ වෙනස් කිරීමක් තිබේද?, ලංසුවේ සඳහන් මිල, වට්ටම් (ලබා දී තිබේනම්) සහ විකල්ප ලංසු ඇතුළුව ලංසු මිල,ලංසු සුරක්ෂණය හෝ ලංසු සුරක්ෂණ ප්‍රකාශයක් තිබීම සහ සේවායෝජකයාට සුදුසු යැයි සලකන වෙනත් විස්තර, ලංසු විවෘත කිරීමේදී කියවන වට්ටම් සහ විකල්ප දීමනා පමණක් ඇගයීම සඳහා සලකා බලනු ලැබේ. ITB උප වගන්තිය 24.1 ප්‍රකාරව ප්‍රමාද වූ ලංසු හැර ලංසු විවෘත කිරීමේදී ලංසු ප්‍රතික්ෂේප කරනු නොලැබේ.

26.4 සේවායෝජකයා විසින් ලංසු විවෘත කිරීමේ වාර්තාවක් සකස් කළ යුතු අතර එයට අවම වශයෙන් ලංසුකරුගේ නම සහ ආපසු ගැනීමක් හෝ වෙනස් කිරීමක් තිබේද යන්න, යම් වට්ටමක් ඇතුලත් වීම, අදාළ නම් කොටස් සඳහා ලංසු මිල, සහ ලංසු සුරක්ෂණයක් හෝ ලංසු සුරක්ෂණ ප්‍රකාශයක් තිබීම හෝ නොපැවතීම ඇතුළත් විය යුතුය. විවෘත කරන ලද ලංසු, ලංසු විවෘත කිරීමෙන් පසු වහාම වෙනම ලියුම් කවරවල නැවත මුද්‍රා තැබිය යුතුය. පැමිණ සිටින ලංසුකරුවන්ගේ නියෝජිතයින්ගෙන් පැමිණීමේ පත්‍රයට අත්සන් කරන ලෙස ඉල්ලා සිටිය යුතුය. නියමිත වේලාවට ලංසු ඉදිරිපත් කළ සියලුම ලංසුකරුවන්ට ලංසු විවෘත කිරීමේ වාර්තාවේ පිටපතක් බෙදා හැරිය යුතුය.

## ලංසු ඇගයීම සහ සංසන්දනය

### 27. රහස්‍යභාවය

27.1 ලංසු පරීක්ෂාව, ඇගයීම, සංසන්දනය සහ පශ්චාත් සුදුසුකම් (අදාළ නම්) සහ කොන්ත්‍රාත් ප්‍රදානය නිර් දේශ කිරීම සම්බන්ධ තොරතුරු කොන්ත්‍රාත් ප්‍රදානය ප්‍රකාශයට පත් කරන තෙක් ලංසුකරුවන්ට හෝ නිල වශයෙන් අදාළ නොවන වෙනත් පුද්ගලයින්ට හෙළි නොකළ යුතුය.

27.2 ලංසු පරීක්ෂාව, ඇගයීම, සංසන්දනය සහ පශ්චාත් සුදුසුකම් (අදාල නම්) පරීක්ෂාවේදී හෝ කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීමේ තීරණවලදී සේවායෝජකයාට බලපෑම් කිරීමට ලංසුකරුවෙකු විසින් දරන ඕනෑම උත්සාහයක් එම ලංසුව ප්‍රතික්ෂේප කිරීමට හේතු විය හැක.

27.3 එනමුත්, ලංසු විවෘත කිරීමේ සිට කොන්ත්‍රාත් ප්‍රදානය කරන අවස්ථාව දක්වා ලංසු තැබීමේ ක්‍රියාවලියට අදාළ ඕනෑම කරුණක් සම්බන්ධයෙන් ලංසුකරු හට සේවායෝජකයා සම්බන්ධ කර ගැනීමට අවශ්‍ය නම්, එය ලිඛිතව ඉදිරිපත් කළ යුතුය.

### 28. ලංසු පැහැදිලි කිරීම

28.1 ලංසු පරීක්ෂා කිරීම, ඇගයීම, සංසන්දනය කිරීම සහ පශ්චාත් සුදුසුකම් සඳහා සහාය වීම සඳහා, සේවායෝජකයාට තම අභිමතය පරිදි, පැහැදිලි කිරීමක් සඳහා ඕනෑම ලංසුකරුවෙකුගෙන් ඉල්ලා සිටිය හැක. පැහැදිලි කිරීම සඳහා සේවායෝජකයාගේ ඉල්ලීම සහ ප්‍රතිචාරය ලිඛිතව විය යුතුය. තම ලංසුව සම්බන්ධයෙන් ලංසුකරුවෙකු විසින් සේවායෝජකයාගේ ඉල්ලීමකට ප්‍රතිචාරයක් නොවන ඕනෑම පැහැදිලි කිරීමක් ඇගයීමේ අරමුණ සඳහා සලකා බලනු නොලැබේ. ITB වගන්තිය 30 අනුව, ලංසු ඇගයීමේ දී සේවායෝජකයා විසින් සොයා ගන්නා ලද අංක ගණිත දෝෂ නිවැරදි කිරීම තහවුරු කිරීම හැර, ලංසුවේ මිල හෝ ද්‍රව්‍යවල වෙනසක් ඉල්ලා සිටීම, ඉදිරිපත් කිරීම හෝ අවසර දීම නොකළ යුතු ය.

### 29. ලංසුවල ප්‍රතිචාරාත්මක බව

29.1 ලංසුවක ප්‍රතිචාරාත්මක බව ගැන සේවායෝජකයාගේ තීරණය ලංසුවේම අන්තර්ගතය මත පදනම් විය යුතුය.

29.2 සාරානුකූලව ප්‍රතිචාරාත්මක ලංසුවක් යනු ලංසු ලේඛනවල ද්‍රව්‍යමය අපගමනය, වෙනස් කිරීම හෝ ඉල්ලා අස්කර ගැනීම නොමැතිව සියලුම නියමයන්, කොන්දේසි සහ පිරිවිතරයන්ට අනුකූල වන ලංසුවකි.

ද්‍රව්‍යමය අපගමනය, වෙනස් කිරීම හෝ ඉල්ලා අස්කර ගැනීම නම්:

(අ) කොන්ත්‍රාත්තුවේ නිශ්චිතව දක්වා ඇති භාණ්ඩ සහ අදාළ සේවාවන්හි විෂය පථය, ගුණාත්මකභාවය හෝ කාර්ය සාධනය කෙරෙහි කිසියම් සැලකිය යුතු ආකාරයකින් බලපායි, හෝ

(ආ) ලංසු ලියකියවිලි වල සඳහන් සේවායෝජකයාගේ අයිතීන් හෝ කොන්ත්‍රාත්තුව යටතේ ලංසුකරුගේ බැඳීම් සමග නොගැලපෙන ඕනෑම සැලකිය යුතු ආකාරයේ සීමාවන්, හෝ

(ඇ) නිවැරදි කළහොත් සැලකිය යුතු ලෙස ප්‍රතිචාර දක්වන ලංසු ඉදිරිපත් කරන අනෙකුත් ලංසුකරුවන්ගේ තරඟකාරී තත්ත්වයට අසාධාරණ ලෙස බලපාන කරුණු.

29.3 ලංසුවක් ලංසු ලේඛනවලට සාරාණුකූලව ප්‍රතිචාර නොදක්වන්නේ නම්, එය සේවායෝජකයා විසින් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ද්‍රව්‍යමය අපගමනය, වෙනස් කිරීම හෝ ඉල්ලා අස්කර ගැනීම නිවැරදි කිරීම මගින් ප්‍රතිචාරාත්මක ලංසුවක් ලෙස සලකනු නොලැබේ.

### 30. නොගැලපීම්, දෝෂ සහ අතපසුවීම්

30.1 ලංසුවක් සාරානුකූලව ප්‍රතිචාරාත්මක ලෙස දක්වනු ලැබුවහොත්, සේවායෝජකයා විසින් ද්‍රව්‍යමය අපගමනයක් ඇති නොවන ලංසුවේ කිසියම් නොගැලපීම් හෝ අතපසුවීම් අත්හැරිය හැක.

30.2 ලංසුවක් සාරානුකූලව ප්‍රතිචාරාත්මක ලෙස දක්වනු ලැබුවහොත්, ලේඛන අවශ්‍යතාවලට අදාළ ලංසුවේ ද්‍රව්‍යමය නොවන නොගැලපීම් හෝ අතපසුවීම් නිවැරදි කිරීම සඳහා සාධාරණ කාලයක් තුළ අවශ්‍ය තොරතුරු හෝ ලියකියවිලි ඉදිරිපත් කරන ලෙස සේවායෝජකයා විසින් ලංසුකරුගෙන් ඉල්ලා සිටිය හැක. එවැනි අතපසුවීමක් ලංසුවේ මිලෙහි කිසිදු අංශයකට සම්බන්ධ නොවිය යුතුය. ලංසුකරු, ඉල්ලීමට අනුකූල වීමට අපොහොසත් වීමෙන් එම ලංසුව ප්‍රතික්ෂේප වීමට හේතු විය හැක.

30.3 ලංසුව සාරානුකූලව ප්‍රතිචාරාත්මක ලෙස දක්වනු ලැබුවහොත්, සේවායෝජකයා පහත පදනම මත අංක ගණිත දෝෂ නිවැරදි කළ යුතුය:

(අ) ඒකක මිල හා ඒකක ප්‍රමාණයෙන් ගුණ කිරීමෙන් ලැබෙන රේඛීය අයිතමයේ එකතුව අතර විෂමතාවයක් තිබේ නම්, සාරානුකූලව ප්‍රතිචාරාත්මක ලෙස දක්වනු ලැබුවහොත් රේඛීය අයිතමයේ එකතුව නිවැරදි කරනු ලැබේ. ඒකක මිලෙහි දශම ලක්ෂ්‍යයේ පැහැදිලි අස්ථානගත වීමක් ඇත්නම්, එම අවස්ථාවේ දී උපුටා දක්වා ඇති රේඛීය අයිතමයේ එකතුව අනුව ඒකක මිල නිවැරදි කරනු ලැබේ.

(ආ) උප එකතු කිරීම් එකතු කිරීමට හෝ අඩු කිරීමට අනුරූප වන එකතුවක දෝෂයක් තිබේ නම්, උප එකතුව අනුව එකතුව නිවැරදි කළ යුතුය.

(ඇ) වචන සහ සංඛ්‍යා අතර විෂමතාවයක් තිබේ නම්, වචනවල ඇති ප්‍රමාණය බලපැවැත්වේ. වචන වලින් ප්‍රකාශ කර ඇත්තේ අංක ගණිත දෝෂයකට සම්බන්ධව නම්, මෙම අවස්ථාවෙහිදී සංඛ්‍යාවල ප්‍රමාණය ඉහත (අ) සහ (ආ) ට යටත්ව පවතිනු ඇත.

30.4 අඩුම තක්සේරු ලංසුව ඉදිරිපත් කළ ලංසුකරු දෝෂ නිවැරදි කිරීම පිළි නොගන්නේ නම්, එම ලංසුව නුසුදුසු සේ සලකන අතර, එහි ලංසු සුරක්ෂණය හෝ ලංසු සුරැකීමේ ප්‍රකාශය අහිමි කරනු ලැබේ.

## 31. ලංසු වල මූලික පරීක්ෂාව

31.1 ITB 12 වැනි වගන්තියේ ඉල්ලා ඇති සියලුම ලේඛන සහ තාක්ෂණික ලියකියවිලි සපයා ඇති බව තහවුරු කිරීමට සහ ඉදිරිපත් කරන ලද එක් එක් ලේඛනයේ සම්පූර්ණත්වය තීරණය කිරීමට සේවායෝජකයා විසින් ලංසු පරීක්ෂා කළ යුතුය.

31.2 ලංසුවෙහි පහත ලියකියවිලි සහ තොරතුරු සපයා ඇති බව සේවායෝජකයා විසින් තහවුරු කළ යුතුය. මෙම ලේඛන හෝ තොරතුරු කිසිවක් නිසිලෙස සපයා නොමැති නම්, ලංසුව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(අ) ITB උපවගන්තිය 13.1 අනුව ලංසු අයදුම් පත්‍රය

(ආ) ITB උප වගන්තිය 15 අනුව මිල උපලේඛන

(ඇ) ITB වගන්තිය 20 අනුව ලංසු සුරක්ෂණය හෝ සුරැකීමේ ප්‍රකාශය.

## 32. නියමයන් සහ කොන්දේසි පරීක්ෂා කිරීම - තාක්ෂණික ඇගයීම

32.1 සේවායෝජකයා විසින් ලංසුව පරීක්ෂා කර, කොන්ත්‍රාත් දත්ත (Contract Data) හි නිශ්චිතව දක්වා ඇති සියලුම නියමයන්, කොන්දේසි සහ කොන්ත්‍රාත් දත්ත ලංසුකරු විසින් කිසිදු ද්‍රව්‍යමය අපගමනයකින් හෝ වෙන් කිරීමකින් තොරව පිළිගෙන ඇති බව තහවුරු කර ගත යුතුය.

32.2 ITB 18 වැනි වගන්තිය අනුව ඉදිරිපත් කරන ලද ලංසුවේ තාක්ෂණික කරුණු සේවායෝජකයා විසින් ඇගයීමට ලක් කළ යුතු අතර, ලංසු ලේඛනවල IV කොටසේ ඇතුළත් අවශ්‍යතා උපලේඛනයේ දක්වා ඇති සියලුම අවශ්‍යතා කිසිදු ද්‍රව්‍යමය අපගමනයකින් හෝ වෙන් කිරීමකින් තොරව සපුරා ඇති බව තහවුරු කල යුතුය.

32.3 නියමයන් සහ කොන්දේසි පරීක්ෂා කිරීමෙන් සහ තාක්ෂණික ඇගයීමෙන් පසුව, සේවායෝජකයා විසින් ITB 29 වගන්තිය අනුව ලංසුව සාරාණුකූලව ප්‍රතිචාරාත්මක නොවන බව නිර් ණය කරන්නේ නම්, සේවායෝජකයා විසින් ලංසුව ප්‍රතික්ෂේප කරයි.

33. ලංසු ඇගයීම

33.1 මෙම ඇගයීමේ අදියර දක්වා, සාරාණුකූලව ප්‍රතිචාරාත්මක වූ සෑම ලංසුවක්ම සේවායෝජකයා විසින් ඇගයීමට ලක් කළ යුතුය.

33.2 ලංසුවක් ඇගයීම සඳහා, සේවායෝජකයා මෙම ITB වගන්තියේ 33 හි දක්වා ඇති සියලුම සාධක, ක්‍රමවේද සහ නිර් නායක පමණක් භාවිතා කළ යුතුය.

33.3 ලංසුවක් ඇගයීම සඳහා, සේවායෝජකයා විසින් පහත සඳහන් කරුණු සලකා බැලිය යුතුය.

(අ) ITB 15 වගන්තියට අනුව දක්වා ඇති ලංසු මිල

(ආ) ITB උප වගන්තිය 30.3 අනුව අංක ගණිත දෝෂ නිවැරදි කිරීම සඳහා මිල ගැලපීම

(ඇ) ITB උප වගන්තිය 15.2 හා 15.3 අනුව ලබා දෙන වට්ටම් හේතුවෙන් මිල ගැලපීම

(ඇ) ලංසු දත්ත පත්‍රිකාවේ (BDS) ලංසු ඇගයීම් සහ සංසන්දනයන්හි නිශ්චිතව දක්වා ඇති නිණර්ායක වලට ගැලපීම.

33.4 ITB උප වගන්තිය 33.3 හි දක්වා ඇති සාධක වලට අමතරව, BDS හි නිශ්චිතව දක්වා ඇති නම් සේවායෝජකයාට, ලංසුවක් ඇගයීමට වෙනත් සාධක සලකා බැලිය හැකිය. මෙම සාධක සේවා හා අදාළ භාණ්ඩවල ලක්ෂණ, කාර් ය සාධනය සහ නියමයන් සහ කොන්දේසි වලට සම්බන්ධ විය හැකිය. තෝරාගත් සාධකවල බලපෑමක් තිබේ නම්, එම ලංසු සංසන්දනය කිරීමේදී මූල්‍යමය වශයෙන් ප්‍රකාශ කළ යුතුය.

33.5 BDS හි එසේ නිශ්චිතව දක්වා තිබේ නම්, මෙම ලංසු තැබීමේ ලියකියවිලි ලංසුකරුවන්ට කොටසක් හෝ කිහිපයක් සඳහා මිල ගණන් ඉදිරිපත් කිරීමට ඉඩ ලබා දෙන අතර, එක් ලංසුකරුවෙකුට වඩා වැඩි ගණනකට කොටසක් හෝ කිහිපයක් ප්‍රදානය කිරීමට සේවායෝජකයා ට අවසර දෙනු ඇත. අඩුම ඇගයුම් කරන ලද කොටස් සංයෝජන නිර් නය කිරීම සඳහා ඇගයීමේ ක්‍රමවේදය ලංසු දත්ත පත්‍රිකාව (BDS) හි, ලංසු ඇගයීම් සහ සංසන්දනය නිර්නායකවල දැක්විය යුතුය.

33.6 ඉදිරිපත් කොට ඇති ලංසුපත් සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර් දේශ ලබා ගැනීමෙන් පසු ප්‍රසම්පාදන කමිටුව වෙත ඉදිරිපත් කරන අතර, එම කමිටුව විසින් සාරානුකූලව ප්‍රතිචාරාත්මක ලංසුකරු තෝරා ගනු ලැබේ. තාක්ෂණික ඇගයීම් කමිටුවට මූලික සුදුසුකම් ඇගයීම සඳහා භාවිතා කළ යුතු ආකෘති පත්‍රය අවශ්‍යතා උපලේඛනය අංක 6 යටතේ ලංසු ඇගයීම් සිදුකරනු ලබන ලංසු ඇගයීම් වාර් තා ලෙස දක්වා ඇත.

34. ලංසු සංසන්දනය

34.1 සේවායෝජකයා විසින් සාරාණුකූලව ප්‍රතිචාරාත්මක අවම ලංසුව තීරණය කිරීම සඳහා සාරාණුකූල ප්‍රතිචාර දක්වන සියලුම ලංසු ITB 33 වගන්තිය අනුව සැසඳිය යුතුය.

35. අභියාචනා ඉදිරිපත් කිරීම.

35.1 ප්‍රසම්පාදන මාර් ගොපදේශ සංග්‍රහය 2024 8.2 අනුව ප්‍රසම්පාදන කමිටුවේ තීරණය එනම් සාර් ථක ලංසුකරුවෙකු තෝරා ගෙන ඔහු වෙත ලංසුව පිරිනැමීමේ අභිලාෂය සියලු ලංසුකරුවන් වෙත වෙන් වෙන්ව ලිඛිතව දැනුම් දෙන අතර අසාථර්ක වීමට හේතු දැන ගැනීමට අවශ්‍ය වන්නේ නම් අසාර්ථක ලංසුකරුවන් හට අමාත්‍යාංශ ප්‍රසම්පාදන අස්ථිත්වය විමසා කරුණු දැන ගැනීමට හැක. අසාර්ථක ලංසු කරුවන් විසින් දැනුම් දී දින 07 ක් ඇතුලත අභියාචනා දක්වා ඇති අමාත්‍යාංශ ප්‍රසම්පාදන අභියාචනා කමිටුව වෙතින් අභියාචනා කල යුතුය. ඉ සෑම අභියාචනාවක් සමඟම රු.25,000.00 ක මුදලක් ක්ෂය රෝග මර් දන හා ළයරෝග පිළිබඳ ජාතික වැඩසටහනේ සරප් වෙත ගෙවා ලබා ගන්නා ලද කුවිතාන්සියේ මුල් පිටපත සමඟ ඉදිරිපත් කළ යුතුය.

35.2 කුවිතාන්සියේ මුල් පිටපත සමඟ නියමිත කාලය තුළ ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අභියාචනා පිළිබඳව සලකා බලනු නොලැබේ.

**36. ලංසුකරුගේ පශ්චාත් සුදුසුකම්**

36.1 සාරාණුකූලව ප්‍රතිචාරාත්මක අවම ලංසුව ඉදිරිපත් කර ඇති තෝරා ගන්නා ලද ලංසුකරු කොන්ත්‍රාත්තුව සතුටුදායක ලෙස ඉටු කිරීමට සුදුසුකම් ලබන්නේද යන්න පිළිබඳ සේවායෝජකයා සෑහීමකට පත්විය යුතුය.

36.2 ITB වගන්තිය 18 ට අනුව ලංසුකරු විසින් ඉදිරිපත් කරන ලද ලංසුකරුගේ සුදුසුකම් පිළිබඳ ලේඛනගත සාක්ෂි පරීක්ෂා කිරීම මත නිර්නය වේ.

36.3 ලංසුකරුට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම සඳහා පූවර් අවශ්‍යතාවයන් සපුරා තිබිය යුතුය. පූවර් අවශ්‍යතාවන් සපුරා නොමැති ලංසු නුසුදුසු ලංසු වීමට හේතු වනු අතර, එහිදී සේවායෝජකයා මීළඟ අඩුම තක්සේරු ලංසුවට යා යුතුය.

36.4 වර් මාන පිරිසිදු කිරීමේ ආයතනය මඟින් අදාළ රෝහල සඳහා ලබා දී ඇති සේවය සම්බන්ධව ආයතන ප්‍රධානියාගේ නිර් දේශ ප්‍රසම්පාදන කමිටුවට ලබා ගැනීමට හැකි අතර ලබා දෙන නිර් දේශ ඇගයීමට ලක් කර රෝගී සත්කාරක සේවය සාර්ථකව ඉටු කිරීම සඳහා ඒම රෝහලට සුදුසු ලංසුකරුවෙකු තෝරා ගැනීමට ඒම නිර් දේශ සාධකයක් ලෙස සැලකිම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත යොමු කිරීම ප්‍රසම්පාදන කමිටුවට හැකිය.

**37. ඕනෑම ලංසුවක් පිළිගැනීමට සහ ඕනෑම හෝ සියලුම ලංසු ප්‍රතික්ෂේප කිරීමට සේවායෝජකයාගේ අයිතිය**

37.1 ඕනෑම ලංසුවක් පිළිගැනීමට හෝ ප්‍රතික්ෂේප කිරීමටත්, ලංසු තැබීමේ ක්‍රියාවලිය අවලංගු කිරීමටත්, කොන්ත්‍රාත් ප්‍රදානයට පෙර ඕනෑම අවස්ථාවක සියලුම ලංසු ප්‍රතික්ෂේප කිරීමටත්, එමගින් ලංසුකරුවන්ට කිසිදු වගකීමක් ඇති නොකර ගැනීමටත් සේවායෝජකයාට අයිතිය ඇත.

## <u>කොන්ත්‍රාත් ප්‍රදානය</u>

**38. ප්‍රදානය කිරීමේ නිර් නායක**

38.1 සේවායෝජකයා විසින් කොන්ත්‍රාත්තුව සතුටුදායක ලෙස ක්‍රියාත්මක කිරීමට සුදුසුකම් ලත් සාරාණුකූලව ප්‍රතිචාරාත්මක අවම ලංසුකරුට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කළ යුතුය.

**39. ප්‍රදානය කරන අවස්ථාවේදී ප්‍රමාණ වෙනස් කිරීමට සේවා යෝජකයාගේ අයිතිය**

39.1 කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරන අවස්ථාවේ දී, ලංසුවේ වෙනත් නියමයන් සහ කොන්දේසි සහ ලංසු ලේඛනවල කිසිදු වෙනසක් සිදු නොවන ලෙස සියයට විසිපහක් දක්වා (25%) හෝ එක ඒකකයක් නොඉක්මවන ආකාරයට, IV කොටසෙහි ඇතුළත් අවශ්‍යතා උපලේඛනයේ වගන්තියේ මුලින් සඳහන් කර ඇති භාණ්ඩ සහ අදාළ සේවා ප්‍රමාණය වැඩි කිරීමට හෝ අඩු කිරීමට සේවායෝජකයාට අයිතිය ඇත.

**40. ලංසු ප්‍රදානය පිළිබඳ දැනුම්දීම**

40.1 ලංසු වලංගු කාලය අවසන් වීමට පෙර, සේවායෝජකයා විසින් සාර් ථක ලංසුකරුට ලංසුව පිළිගෙන ඇති බව ලිඛිතව දැනුම් දිය යුතුය.

40.2 විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් සකස් කර ක්‍රියාත්මක කරන තුරු, ප්‍රදානය කිරීමේ දැනුම්දීම බැඳීම් කොන්ත්‍රාත්තුවක් විය යුතුය.

40.3 සාථර්ක ලංසුකරු විසින් අත්සන් කරන ලද කොන්ත්‍රාත් පෝරමය සහ ITB 42 වගන්තියට අනුකූලව කාර් ය සාධන සුරක්ෂණය ලබා දීමෙන් පසු, සේවායෝජකයා විසින් එක් එක් අ සාර් ථක ලංසුකරුට වහාම දැනුම් දෙන අතර ITB වගන්තිය 20.4 අනුව එහි ලංසු සුරක්ෂණය මුදා හරිනු ඇත.

**41. කොන්ත්‍රාත්තුව අත්සන් කිරීම**

41.1 දැනුම් දීමෙන් පසු දින දාහතරක් (14) ඇතුළත, සේවායෝජකයා ගිවිසුම සම්පූර්න කර, එය අත්සන් කරන ලෙස සාර්ථක ලංසුකරුට දැනුම් දිය යුතුය.

41.2 එවැනි තොරතුරු ලැබීමෙන් දින දාහතරක් (14) ඇතුළත, සාර්ථක ලංසුකරු ගිවිසුම අත්සන් කළ යුතුය.

41.3 නියමිත කාලය තුළ ගිවිසුම් අත්සන් කිරීමට තෝරාගත් ලංසුකරු අපොහොසත් වුවහොත් ප්‍රතිචාරාත්මක ඊලග ලංසුකරු වෙත ලංසුව පිරිනැමීම සම්බන්ධයෙන් සලකා බලනු ලැබේ.

42. **කාර්යසාධන සුරක්ෂණය**

42.1 සේවායෝජකයාගෙන් කොන්ත්‍රාත් ප්‍රදානය පිළිබඳ දැනුම්දීම ලැබීමෙන් දින දාහතරක් (14) ඇතුළත, අවශ්‍ය නම් සාර්ථක ලංසුකරු විසින් VII වන කොටසෙහි දැක්වෙන කොන්ත්‍රාත් ආකෘති පත්‍රවල ඇතුළත් කාර්ය සාධන සුරක්ෂණය පෝරමය භාවිතා කරමින්, ලංසු කොන්දේසිවලට අනුකූලව කාර්යසාධන සුරක්ෂණය සැපයිය යුතුය. සේවායෝජකයා විසින් ජයග්‍රාහී ලංසුකරුගේ නම එක් එක් අ සාර් ථක ලංසුකරු වෙත කඩිනමින් දැනුම් දිය යුතු අතර ITB උප වගන්තිය 20.4 ට අනුව අසාර්ථක ලංසුකරුවන්ගේ ලංසු සුරැකුම්පත් නිකුත් කළ යුතුය.

42.2 සාර්ථක ලංසුකරු ඉහත සඳහන් කායර් සාධන සුරක්ෂණය ඉදිරිපත් කිරීමට හෝ කොන්ත්‍රාත්තුවට අත්සන් කිරීමට අපොහොසත් වීම ලංසු ප්‍රදානය අවලංගු කිරීමට සහ ලංසු සුරක්ෂණය අහිමි කිරීමට හෝ ලංසු සුරක්ෂණ ප්‍රකාශය අහිමි කිරීමට ප්‍රමාණවත් හේතු වේ. එම අවස්ථාවෙහිදී සේවායෝජකයා විසින් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කළ හැක්කේ ඊළඟ අඩුම ඇගයීමට ලක් වූ ලංසුකරුට වන අතර, ඔහුගේ පිරිනැමීම සැලකිය යුතු ලෙස ප්‍රතිචාර දක්වන අතර කොන්ත්‍රාත්තුව සතුටුදායක ලෙස ඉටු කිරීමට සුදුසුකම් ලැබීමට සේවායෝජකයා විසින් තීරණය කරනු ලැබේ.

# II කොටස. ලංසු දත්ත පත්‍රිකාව (BDS)

ප්‍රසම්පාදනය කළ යුතු සේවා හා භාණ්ඩ සඳහා පහත සඳහන් නිශ්චිත දත්ත අනුපූරක, අතිරේක,හෝ ලංසුකරුවන්ට උපදෙස් (ITB) හි විධිවිධාන සංශෝධනය විය යුතුය. සෑම විටම මෙහි ඇති විධිවිධාන ලංසුකරුවන් සඳහා වන උපදෙස් (ITB) හි ඇති විධිවිධානවලට අනනුකූල වන්නේ නම් මෙහි විධිවිධාන බලපැවැත්විය යුතුය.

| **ITB** වගන්ති යොමුව | පොදු |
|---|---|
| ITB 1.1 | සේවා යෝජකයා: ක්ෂය රෝග මර්දන හා ළය රෝග පිළිබඳ ජාතික වැඩසටහන |
| ITB 1.1 | කොන්ත්‍රාත්තුවේ නම : පිරිසිදු කිරීමේ සේවය සැපයීම - 2026 /2029<br>රෝහල/ ආයතනය : ක්ෂය රෝග මර්දන හා ළය රෝග පිළිබඳ ජාතික වැඩසටහන<br>හඳුනාගැනීමේ අංකය: NPTCCD/CLE/2026-2029/02 |
| ITB 2.1 | අරමුදල් ප්‍රභවය :ශ්‍රී ලංකා ජනරජයේ අරමුදල |
| ITB 4.4 | විදේශීය ලංසුකරුවන්ට ලංසු තැබීමට සහභාගී වීමට අවසර නැත. |
| | **B. ලංසු තැබීමේ ලේඛනවල අන්තගර්තය** |
| ITB 7.1 | ලංසු අරමුණු පැහැදිලි කිරීම සඳහා පමණක්, සේවා යෝජකයාගේ ලිපිනය වන්නේ:<br>අවධානය : ......................................<br>ලිපිනය : ක්ෂය රෝග මර්දන හා ළය රෝග පිළිබඳ ජාතික වැඩසටහන,<br>මහජන සෞඛ්‍ය සංකීර්නය ,<br>අංක 555/5, ඇල්විටිගල මාවත ,<br>කොළඹ 05 .<br>දුරකථන 0112368274, 0112368275<br>ෆැක්ස් අංකය: 0112368275<br>විද්‍යුත් තැපැල් ලිපිනය:...nptccddirector@gmail.com |
| | **C. ලංසු සකස් කිරීම** |
| ITB 11.1 (ඉ) | ලංසුකරු විසින් පහත ලේඛන වල මුද්‍රිත පිටපත් ඉදිරිපත් කළ යුතුය.<br>a)<br>• III කොටසෙහි ඇතුළත් ලංසු ආකෘති පත්‍ර යටතේ ඇති ලංසු අයදුම් පත්‍රය හා IV කොටසෙහි ඇතුළත් අවශ්‍යතා උපලේඛනයේ දක්වා ඇති පහත සඳහන් ලැයිස්තු<br>1. පිරිසිදු කිරීමේ සේවාව සැපයීම සඳහා පරික්ෂකයන්/සේවකයන් යෙදවිය යුතු ආකාරය (ඇමුණුම I)<br>2. කොන්ත්‍රාත් කාලය තුළ පිරිසිදු කිරීමේ සේවා සඳහා වාර්ෂිකව සපයා ගත යුතු උපකරණ ලැයිස්තුව. (ඇමුණුම II)<br>3. පිරිසිදු කිරීමේ සේවාව සඳහා ලංසුකරුවන් විසින් ඉදිරිපත් කළ යුතු අවම වාර්ෂික පිරිවැය පිළිබඳ තොරතුරු වාතර්ාව (ඇමුණුම III )<br>• III කොටසේ ලංසු ආකෘති පත්‍ර යටතේ අංක 2 හි සඳහන් වාර්ෂික පිරිවැය ලේඛනයේ අංක 7 යටතේ ඇති පොදු කායර් පිරිවැය පහත වියදම් යටතේ දැක්විය යුතුය.<br>1)සේවක නඩත්තුව සඳහා වන පිරිවැය (ශ්‍රම පිරිවැය හැර)<br>2)වාර්ෂික ව සැපයිය යුතු උපකරණ පිරිවැය (IV කොටසේ අංක II ලැයිස්තුව)<br>3)වෙනත් පිරිවැය (වෙන් වෙන් වශයෙන් සඳහන් කළ යුතුය.)<br>b) ලංසුකරුගේ ප්‍රකාශය<br>c) ලංසු සුරක්ෂණය ( මුදලින් ගෙවන්නේ නම් අදාල මුදල **සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යංශයේ** සරප් වෙත ගෙවා කුවිතාන්සියේ මුල්පිටපත ඉදිරිපත් කර තිබිය යුතුය) |

d) පිරිසිදු කිරීමේ සේවාව ඉටුකිරීම සඳහා ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ සහතිකය (සහතික කළ පිටපතක්) (ශ්‍රී ලංකාවේ ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීම් ආඥා පනත හෝ 2007 අංක 07 දරණ සමාගම් පණත යටතේ පිරිසිදු කිරීමේ සේවය සැපයීමේ ආයතනයක් ලෙස ලියාපදිංචි වූ ආයතනයක් විය යුතුය.)

e) රාජ්‍ය, අර්ධ රාජ්‍ය ආයතනයක හෝ පෞද්ගලික රෝහලක පසුගිය වසර තුන (03) තුළ අවම වසරක පළපුරුද්ද පිළිබඳ අදාළ ආයතන සමඟ එළඹී ගිවිසුම් (සහතික කළ පිටපත්) (මෙම කොන්ත්‍රත්තුව සඳහා ඉදිරිපත් කරනු ලබන සේවක සංඛ්‍යාවෙන් අවම වශයෙන් 25% ප්‍රමාණයක්වත් පෙර සේවය සපයන ලද සේවා ගිවිසුම් තුල සේවය සැපයීම සඳහා සපයා ඇති බවට තහවුරු කළ යුතුය.)

f) සේවක අර්ථසාධක අරමුදල් හා සේවක භාරකාර අරමුදල සඳහා ලංසු අයදුම් පතෙහි අංක 14හි සඳහන් සේවක සංඛ්‍යාව සඳහා කොපමණ සේවක සංඛ්‍යාවකට කොපමණ මුදලක් ගෙවා ඇත්ද යන බවට ශ්‍රී ලංකා මහ බැංකුවෙන්/සේවක භාරකාර අරමුදලෙන්, පසුගිය වසර 03 තුළ මාස 12කට අදාල ගෙවීම් සහතිකයන්හි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කල යුතුය.

g) වරලත් විගණන ආයතනයකින්, ආයතනයේ විගණනය කරන ලද 2) වාර්ෂික ගිණුම් ප්‍රකාශන (පූර්වාසන්න වසර දෙකකින් එක් වර්ෂයකට අදාලව) සහ ලංසු දැන්වීමෙහි වගුවේ සඳහන් මසකට අවමය හෝ ඊට වැඩි වන පරිදි කොන්දේසි රහිත බැංකු අයිරා පහසුකම් ලබාදෙන බවට කොන්ත්‍රාත්කරු ගනුදෙනු කරන බැංකුවෙන් නිකුත් කළ ලිපියක් (මුල් පිටපත) (කොන්ත්‍රාත්කරු විසින් රෝහල්/ආයතන කිහිපයකට මිල ගණන් ඉදිරිපත් කරනු ලබන්නේ නම් එම රෝහල්/ආයතනවලට අදාළ බැංකු අයිරා වටිනාකම්වල එකතුවට සමාන හෝ වැඩි වටිනාකමට ලබාගත් සහතිකයක් විය යුතුය. ලංසු විවෘත කිරීමේ දිනයට පෙර මසක් ඇතුළත ලබාගත් සහතිකයක් විය යුතුය. එමෙන්ම කොන්ත්‍රාත්කරු විසින් රෝහල්/ආයතන කිහිපයකට මිල ගණන් ඉදිරිපත් කරනු ලබන්නේ නම් එම ආයතනයන්හි නාම ලේඛනයද ඉදිරිපත් කළ යුතුය)

h) තත්කාලීනව බලපවත්නා වූ සියලුම නීතිරීතිවලට අනුකූලව (පඩිපාලක සභා වැටුප්, අයවැය සහන දීමනා, අතිකාල, සේවක අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල) කටයුතු කරන ආයතනයක් බවට මාස 06ක් ඇතුළත ආයතනය ලියාපදිංචි ප්‍රදේශය භාර සහකාර කම්කරු කොමසාරිස් වෙතින් ලබාගත් සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.

i) පොදු කොන්ත්‍රාත් පනතේ 08 වැනි වගන්තිය යටතේ වන ලියාපදිංචි සහතිකය (මුල් පිටපත) ඒ ඒ රෝහල/ආයතන සඳහා වෙන වෙන ම ලියාපදිංචි සහතික ඉදිරිපත් කළ යුතුය.

j) සක්‍රියව ආදායම් බදු ගෙවන බවට සනාථ කිරීමට දේශීය ආදායම් බදු දෙපාතර්මේන්තුවේ තම ආයතනය නමින් ප්‍රේෂණය කරන ලද පූවර් වර්ෂයේ ප්‍රේෂණ පිටපත්.

k) අවශ්‍යතා උපලේඛනයේ (IV කොටසේ) අංක 5 ලැයිස්තුවේ, දක්වා ඇති ඒ ඒ රෝහල/ආයතනය සඳහා ඉදිරිපත් කර ඇති තොරතුරුවලට අනුව දෛනික පිරිවැය ගණනය කර ඒ අනුව 2) වාර්ෂික ශ්‍රම පිරිවැය ඉදිරිපත් කළ යුතුය. එම ලැයිස්තුවෙහි දැක්වෙන වැටුප් හා අතිකාල ගණනය කළ ආකාරයට වඩා බැහැරව යම් ලංසුකරුවෙකු ඉදිරිපත් කරන වැටුප් හා අතිකාල ප්‍රමාණ ඉක්ම වන්නේ නම් එම වැටුප් හා අතිකාල ගණනය කළ ආකාරය ලංසුකරු විසින් සහතික කර ඉදිරිපත් කළ යුතුයි.

l) VAT බදු ලියාපදංචි සහතිකයේ පිටපතක් (VAT බදු සඳහා ලියාපදිංචි වී නොමැති බවට සහතිකයක් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් දෙපාතර්මේන්තුව වෙතින් ලබා ගත් ලිපියක් ) සමඟ අදාල තක්සේරු වර් ෂයේ VAT බදු ගෙවීම් පිළිබඳ වැට් බදු නිශ්කාෂණ

| | |
|---|---|
| | සහතික පිටපත් දේශීය ආදායම් දෙපාතර්මේන්තුවේ නිලධාරියකු විසින් සහතික කර ඉදිරිපත් කළ යුතුය.<br><br>m) ලංසුව ඉදිරිපත් කරනු ලබන්නේ හවුල් ව්‍යාපාර නාමයකින් හෝ සමාගම් පනත යටතේ ලියාපදිංචි සමාගමකින් නම්, ලංසු අයදුම්පත, ලංසු කොන්දේසි, ගිවිසුම ඇතුළු මෙම ප්‍රසම්පාදනයට අදාළ සියලු කටයුතු සඳහා වන බලය පැවරීමේ ලේඛනයක්<br><br>n) පසුගිය වෂර්වල රෝහල්වල/ආයතනවල ආයතන ප්‍රධානියා හෝ බලය පැවරූ නිලධාරියෙකුගෙන් පිරිසිදු කිරීමේ සේවා කටයුතු ඉටු කිරීමේදී ලංසුකරු සම්බන්ධයෙන් ලැබී ඇති සේවා වාතර්ා<br><br>o) මෙම කොන්ත්‍රාත්තුවට අදාළ කායර් මණ්ඩලය සපයා ගැනීමට ඇති හැකියාව ඇති බවට ලංසුකරුගේ දිවුරුම් ප්‍රකාශයක්.<br><br>p) රෝහල්/ආයතනයේ ක්‍රියාත්මක වන ඵලදායීතා සහ වතර්මානයේ ක්‍රියාත්මක වන ක්ලීන් ශ්‍රී ලංකා වැඩසටහන සඳහා සහයෝගය ලබාදෙමින් පිරිසිදු කිරීමේ සේවාව සපයන බවට ලංසුකරුගේ ප්‍රකාශයක්<br><br>q) ලංසු ආකෘති පත්‍රවල (III කොටසේ) සඳහන් කාර්යය මණ්ඩල විස්තරය<br><br>r) එක් එක් රෝහල් සඳහා ලංසු ඉදිරිපත් කිරීමේ දී රජයට අනුබද්ධ ආයතන හැර අනෙකුත් ආයතන ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරන ලද පොදු 170 වත්කම් සහතිකය ලංසු විවෘත කරන දිනට මාස හයක් (06) තුල ලබා ගත් සහතිකය පහත පරිදි ලබා දීම. (මෙහි දී පොදු 170 සහතිකය හැර ඉදිරිපත් කරනු ලබන වෙනත් සහතික පිළිගත නොහැක)<br><br>1. ශික්ෂණ රෝහලක් හෝ මහ රෝහලක් සඳහා රු.1,000,000.00<br>2. මූලික රෝහලක් හෝ දිසා රෝහලක් සඳහා හා විශේෂිත රෝහල් සඳහා රු. 500,000.00<br>3. සෞඛ්‍ය ආයතනයක් හෝ හෙද විදුහලක් සඳහා සහ වෙනත් රු. 300,000.00 |
| ITB 15.1 | ලංසුකරු විසින් සියලු වියදම් ශ්‍රී ලංකා රුපියල් වලින් දැක්විය යුතුය. |
| ITB 19.1 | ලංසුවේ වලංගු කාලය, ලංසු විවෘත කරන දින සිට දින 91ක් දක්වා වලංගු විය යුතුය. |
| ITB 20.1 | ලංසු ආකෘති පත්‍රවල III කොටසෙහි ඇතුලත් ආකෘති පත්‍රය ප්‍රකාරව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කර ඇති වාණිජ බැංකුවකින් නිකුත් කරන ලද ලංසු සුරැකුමක් ඇතුළත් විය යුතුය. මෙම ලංසු සුරැකුම මුදල් ඇපකරයක් මගින්ද ඉදිරිපත් කළ හැක. ලංසු සුරක්ෂණය අධ්‍යක්ෂ, **ක්ෂය රෝග මර්දන හා ළය රෝග පිළිබඳ ජාතික වැඩසටහන** නමට ඉදිරිපත් කල යුතුය. |
| ITB 20.2 | ලංසු සුරක්ෂණය රු.**544,200.00** වටිනාකමින් යුක්ත විය යුතුය.<br><br>ලංසු සුරක්ෂණයේ වලංගු කාලය **.2026-04-21.**දින සිට **2026-07-20** දින දක්වා විය යුතුය. |
| | **D. ලංසු ඉදිරිපත් කිරිම සහ විවෘත කිරිම** |
| ITB 22.2 | ඇතුළත සහ පිටත ලියුම් කවරවල රෝහල්/ආයතනයට අදාළ නම සහ ප්‍රසම්පාදන අංකය සටහන් කළ යුතුය. |
| ITB 23 | ලංසු ඉදිරිපත් කිරීමේ අවසාන දිනය**:** ......2026-04-21............<br><br>වේලාව**:** පෙ.ව.... 10.00 am........ |

| | |
|---|---|
| ITB 23.1 | ලංසු ඉදිරිපත් කිරීම සඳහා, සේවායෝජකයාගේ ලිපිනය වන්නේ:<br><br>අවධානය : සභාපති, ක්ෂය රෝග මර්දන හා ළය රෝග පිළිබඳ ජාතික වැඩසටහන<br><br>ලිපිනය : මහජන සෞඛ්‍ය සංකීර්නය ,<br>අංක 555/5, ඇල්විටිගල මාවත ,<br>කොළඹ 05 . |
| ITB 26.1 | ලංසු විවෘත කිරීම සිදු වන්නේ:<br><br>ලිපිනය : ක්ෂය රෝග මර්දන හා ළය රෝග පිළිබඳ ජාතික වැඩසටහන,<br>මහජන සෞඛ්‍ය සංකීර්නය ,<br>අංක 555/5, ඇල්විටිගල මාවත ,<br>කොළඹ 05 .<br><br>දිනය : .2026-04-21....<br><br>**වේලාව** : ....10.00 am.................. |
| | **E. ලංසු ඇගයීම සහ සංසන්දනය** |
| ITB 33.4 | ඇගයීම සඳහා පහත සඳහන් සාධක සහ ක්‍රමවේදය භාවිතා කරනු ඇත:<br><br>1. ඉහත C කොටසෙහි අංක “a සිට h” හි දැක්වෙන සියලුම ලේඛන නොඅඩුව ඉදිරිපත් කළ යුතු අතර ඉන් එකක් හෝ ඉදිරිපත් කර නොමැති ලංසු සම්බන්ධයෙන් ගනු ලබන අවසාන තීරණය ගැනීමේ බලය ප්‍රසම්පාදන කමිටුව සතු වේ.තවද “i සිට r” දක්වා වන සෙසු ලේඛන මූලික ලංසු ඇගයීමේදී ඉදිරිපත් නොකිරීම සුළු අපගමනයන් (Minor deviation) ලෙස සළකනු ලැබේ.කෙසේ වෙතත් අවසන් ඇගයීමේදී ඉදිරිපත් කර ඇති සියළු ලේඛන පිළිබඳ අවධානය යොමු කරනු ලැබේ.<br><br>2. අවශ්‍යතා උපලේඛනයේ (IV කොටසේ) III ලැයිස්තුවේ කම්කරු දෙපාතර්මේන්තුවේ තත්කාලීන නීතිමය ප්‍රතිපාදනවලට අනුකූලව ඒ ඒ රොහල්/ආයතන සඳහා සඳහන් කර ඇති තොරතුරුවලට අනුව වාෂරීක ශ්‍රම පිරිවැය ගණනය කර ඉදිරිපත් කළ යුතුය.<br><br>3. වාෂරීක පොදු කායර්ය සඳහා වන පිරිවැය ලංසුවෙහි III කොටසේ අංක 02 යටතේ වන ලංසුකරු විසින් ඉදිරිපත් කරනු ලබන වාෂරීක පිරිවැය ලේඛණයේ අංක III යටතේ සඳහන් කර ඇති වැටුප් සහ අතිකාල සඳහා වන මුළු වියදමෙන් 10%ක් නොඉක්මවිය යුතුය.<br><br>4. ලංසු ඉදිරිපත් කළ ආයතනයන්ට එරෙහිව රෝහල්/ආයතනයන්හි දෛනික කටයුතුවලට දැඩි බලපෑමක් එල්ල වන ආකාරයේ පැමිණිල්ලක් හෝ පැමිණිලි ලැබී තිබේ නම් එය පශ්චාත් සුදුසුකම් පරීක්ෂාවේ දී ප්‍රතිචාරාත්මක ලංසුකරුවෙක් ලෙස නොසැළකීමට හේතුවක් වේ. |
| | **කාර්ය සාධන සුරක්ෂණය** |
| ITB 41.1 | ලංසු ප්‍රදානය ලද කොන්ත්‍රාත්කරු, ලංසු පිළිගැනීමේ ලිපිය ඉදිරිපත් කර දින 14ක් ඇතුළත ලංසුවේ කොන්ත්‍රාත්තුවේ වටිනාකමින් 10%ක් හෝ ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය අනුව දැනුම් දෙනු ලබන වටිනාකමින් යුත් කායර් සාධන බැඳුම්කරයක්, මහ බැංකුව විසින් අනුමත කරන ලද වාණිජ බැංකුවකින් ලබා ගෙන **ක්ෂය රෝග මර් දන හා ළය රෝග පිළිබද ජාතික වැඩසටහන, අධ්‍යක්ෂ** නමට ඉදිරිපත් කළ යුතුය. |

# III කොටස - ලංසු ආකෘතිපත්‍ර

1. පිරිසිදු කිරීමේ සේවය සැපයීම 2025/2026 ට අදාළ ලංසු අයදුම් පත්‍රය
2. පිරිසිදු කිරීමේ සේවාව සඳහා ලංසුකරුවන් විසින් ඉදිරිපත් කරනු ලබන වාර්ෂික පිරිවැය ලේඛනය
3. ලංසු සුරක්ෂණය
4. ලංසුකරුගේ ප්‍රකාශය
5. කාර්ය මණ්ඩල විස්තරය

## 1.පිරිසිදු කිරීමේ සේවය සැපයීම 2026 /2029

### ලංසු අයදුම් පත්‍රය

1. ලංසුකරුගේ නම :-

……………………………………………………………………………………………………………………………

……………………………………………………………………………………………………………………………

(පෞද්ගලික ව්‍යාපාරයක් නම්, අයිතිකරුගේ සම්පූර්ණ නම, සීමාසහිත පෞද්ගලික සමාගමක් නම් සමාගමේ නම)

2. ලිපිනය : .

……………………………………………………………………………………………………………………………

……………………………………………………………………………………………………………………………

……………………………………………………………………………………………………………………………

(පෞද්ගලික ව්‍යාපාරයක් නම්, අයිතිකරුගේ ව්‍යාපාරික ලිපිනය, සීමාසහිත පෞද්ගලික සමාගමක් නම් සමාගමේ ලිපිනය)

3. දුරකථන අංකය :- ………………………………… ෆැක්ස් :…………………………………………………

ඊ මේල් :- ………………………………… ජංගම දුරකථන අංකය:- ………………………………

4. ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ හෝ 2007 අංක 07 දරණ සමාගම් පණත යටතේ ලියාපදිංචි කිරීමේ අංකය හා දිනය: - ……………………………………………………………………………………

(ලියාපදිංචි කිරීමේ සහතිකයේ සහතික කළ පිටපතක් ඉදිරිපත් කළ යුතුය.)

5. ආයතනයේ අයිතිකරුවෝ / අධ්‍යක්ෂ මණ්ඩලය

| | නම | පෞද්ගලික ලිපිනය | දුරකථන අංකය |
|---|---|---|---|
| I | | | |
| II | | | |
| III | | | |
| IV | | | |
| V | | | |

(මෙය ප්‍රමාණවත් නොවන්නේ නම් මෙහි අදාළ විස්තර වෙනත් ඇමුණුමක් මඟින් ඉදිරිපත් කරන්න.)

(අධ්‍යක්ෂ මණ්ඩලය ඇතුළත් පෝරමය (FORM 01) හි සහතික කල පිටපතක් ඉදිරිපත් කල යුතුය.)

6. ලංසු බැඳුම්කරය (මුදල් ගෙවූ රිසිට්පත හෝ බැංකු ඇපකරය)

| දිනය | අංකය | මුදල | බැංකුවේ නම |
|---|---|---|---|
| | | | |

7. ආදායම් බදු ලිපි ගොනුවේ අංකය :-…………………………………………………………………………………………

(දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගෙන් ලබා ගත් ගෙවීම් සහතිකය සමඟ, 2023/2024 තක්සේරු වෂර්යන්ට අදාළ ගෙවීම් පිළිබඳ ප්‍රේෂණ පත්‍රවල පිටපත් දේශීය ආදායම් දෙපාතර්මේන්තුවේ නිලධාරියකු විසින් සහතික කර ඉදිරිපත් කළ යුතුය.)

8. වැට් බදු අංකය :- …………………………………………………………

(දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගෙන් ලබාගත් ලියාපදිංචි සහතිකය සමඟ 2023/2024 තක්සේරු වෂර්යේ ගෙවීම් පිළිබඳ ප්‍රේෂණ පත්‍ර පිටපත් හා වැට් බදු ගෙවූ බවට ලබාදෙන වැට් බදු නිෂ්කාෂණ සහතික පිටපත් දේශීය ආදායම් දෙපාතර්මේන්තුවේ නිලධාරියකු විසින් සහතික කර ඉදිරිපත් කළ යුතුය.)

9. I. සේවා යෝජකයාගේ අථර්සාධක අරමුදල් අංකය: ……………………………………………………

II.සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් අංකය: …………………………………………………………

10. ආයතනයේ මූල්‍යමය හැකියාව සනාථ කරන ලේඛන ඉදිරිපත් කර තිබේ ද යන වග …………………………………

I. 2023/2024 වෂර්යට අදාළව වරලත් විගණන ආයතනයකින් විගණනය කරන ලද ගිණුම් වාතර්ා ඉදිරිපත් කළ යුතුය. එම විගණන ආයතනයේ නිලධාරීගේ අත්සන සහ නිල මුද්‍රාව තිබිය යුතුය.)

II. බැංකුවෙන් බැංකු අයිරා පහසුකම් ලබාදෙන බවට නිකුත් කළ සහතිකයේ වටිනාකම රු.………………………………

(කොන්ත්‍රාත්කරු විසින් ලංසු දැන්වීමෙහි සඳහන් රෝහල් හෝ ආයතන කිහිපයකට මිල ගණන් ඉදිරිපත් කරන්නේ නම්, එම රෝහල්/ආයතනවලට අදාළ බැංකු අයිරා වටිනාකම්වල එකතුවට සමාන හෝ වැඩි වටිනාකමට ලබාගත් සහතිකයක් විය යුතු අතර එහි මුල් පිටපත ලංසු ලියවිලි සමඟ ඉදිරිපත් කළ යුතුය.) (ලංසු විවෘත කිරීමේ දිනයට පෙර මසක් ඇතුළත ලබාගත් සහතිකයක් විය යුතුය.)

11. සේවා සැපයීම සඳහා මාසිකව/වාෂර්ිකව ඉල්ලුම් කරන මුදල :-

| කාලය | වැට් රහිත (රුපියල්) | වැට් සහිත (රුපියල්) |
|---|---|---|
| සම්පූණර් මාසික මුළු පිරිවැය | | |
| සම්පූණර් වාෂර්ික මුළු පිරිවැය | | |

වැට් හැර වෙනත් බදු හෝ වෙනත් සේවා ගාස්තු ගෙවීමට නොබැඳෙන අතර අනෙකුත් සියළු බදු පිරිවැයට ඇතුලත් විය යුතුය. නැතහොත් එය ලංසුකරු විසින් දරා ගත යුතුය.

(ලංසු ආකෘතිපත්‍ර වල ඇතුළත් වාර්ෂික මුළු පිරිවැය ලේඛනය හි සඳහන් මුළු පිරිවැයට සමානව ඉහත මාසික මුළු පිරිවැය ඉදිරිපත් කළ යුතුය.)

12. ඔබගේ ආයතනය අවසන් වසර 05 තුළ සේවා සපයා ඇති ආයතන පිළිබඳ විස්තර ( වසර 05 තුල අඛණ්ඩව සේවය සැපයීම අත්‍යවශ්‍ය නොවන අතර එම ආයතන වෙතින් සේවා සැපයුම සම්බන්ධව ලැබී ඇති පළපුරුද්ද

පිළිබඳ එහි ආයතන ප්‍රධානියා හෝ බලය පවරන ලද වෙනත් නිලධාරියෙකු විසින් සහතික කළ විධිමත් සහතිකයක් ඇමිණිය යුතුය.)

| | ආයතනයේ නම | ලිපිනය | වාෂරීක වටිනාකම |
|---|---|---|---|
| I. | ……………………………… | ……………………………………………… | ……………………………………… |
| II. | ……………………………… | ……………………………………………… | ……………………………………… |
| III. | ……………………………… | ……………………………………………… | ……………………………………… |
| IV. | ……………………………… | ……………………………………………… | ……………………………………… |

(මෙය ප්‍රමාණවත් නොවන්නේ නම් ඇමුණුමක් මඟින් ඉදිරිපත් කළ යුතුය.)

13. දැනට ආයතනය සතු සේවක සංඛ්‍යාව :- I. පරීක්ෂක ගැහැණු………………………
පිරිමි…………………………
II. කම්කරු:- ගැහැණු………………………
පිරිමි…………………………

14. වහාම සේවයේ යෙදවීම සඳහා ආයතනයට සපයා ගත හැකි සේවක ප්‍රමාණය :-
ගැහැණු……………………
පිරිමි………………………

15. A. යම් සේවාලාභී ආයතනයක් විසින් මීට පෙර ඔබේ සේවා සැපයීම අත්හිටුවා තිබේද? ……………………..

B. යම් සේවා ලාභී ආයතනයක් විසින් ඔබේ සේවා සැපයුම පිළිබඳව සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත පැමිණිලිකර තිබේද? යන වග………………………………………………………………

(පෙර සේවා සැපයූ ආයතන පිළිබඳ විස්තර ඇමුණුමක් මඟින් ඉදිරිපත් කළ යුතුය.)

16. ආදායම් බදු හෝ රජයට ගෙවිය යුතු එබඳු යම් මුදලක් ගෙවීම් පැහැර හැරීම සම්බන්ධයෙන් ඔබ ආයතනය අධිකරණයේ දී වරදකරු වී තිබේද? ………………………………………

17. කම්කරු දෙපාතර්මේන්තුවේ ශ්‍රම ප්‍රමිති අංශයෙන් ශ්‍රමිකයන්ට ගෙවිය යුතු අවම දෛනික වැටුප සඳහන් 2018.07.16 දිනැති හා අංක 2080/22 දරණ ගැසට් පත්‍රය, 2005 අයවැය සහන දීමනා පනත, 2016 අංක 03 දරණ ජාතික අවම වේතන පනත, 2016 අංක 4 අයවැය දීමනා සහන දීමනා සංශෝධන පනත,2021 අංක 16 දරණ සේවකයන්ගේ ජාතික අවම වේතන (සංශෝධන) පනතෙන් සංශෝධිත පනත , 2016 අයවැය සහන දීමනා පනත, 2024 අංක 48 ජාතික අවම වේතන පනත සංශෝධන පනත ,2025 අංක 9-10 අයවැය සහන දීමනා පනත 2025 අංක 11 දරන සේවකයන්ගේ ජාතික අවම වේතනය (සංශෝධන) පනත යනාදියෙහි විධිවිධාන ප්‍රකාරව සේවකයින්ට වැටුප් ගෙවන බවට මාස 06ක් ඇතුළත, අදාළ ප්‍රදේශය භාර සහකාර කම්කරු කොමසාරිස් හෝ බලයලත් නිලධාරියෙකුගෙන්, ලබාගත් සහතිකයක් මේ සමඟ ඇමිණිය යුතුය.

මා විසින් ඉහත කරන ලද ප්‍රකාශය සත්‍ය බවත්, නිවැරදි බවත් ප්‍රකාශ කරමි.

තවද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පවත්නා නීතිරීතිවලට හා කලින් කල හඳුන්වා දෙනු ලැබිය හැකි නීතිරීතිවලට එකඟව ද, සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයට අනුබද්ධ රෝහල්/ආයතනවල පවත්නා නීතිරීතිවලටද, කම්කරු නීතිරීතිවලටද ලංසු කොන්දේසිවලටද එකඟ වන බව ප්‍රකාශ කර සිටිමි.

මගේ සේවා සැපයුමේ අසාථර්කභාවය හෝ ලංසු කොන්දේසි හෝ වෙනත් නීතිරීති උල්ලංඝණය කිරීම යන ඕනෑම කාරණයක් හේතු කොට ගෙන මගේ සේවා සැපයුම අවලංගු කිරීමට හෝ වෙනත් දඬුවමකට යටත්වීමට එකඟවන බවද ප්‍රකාශ කර සිටිමි.

ලංසුකරුගේ අත්සන :-……………………………………………………………………………

දිනය :-……………………………………………………………………………

ලංසුකරුගේ නම/ආයතනයේ නම :- ……………………………………………………………………………………

ලිපිනය :-……………………………………………………………………………………………………

……………………………………………………………………………………………………………

හැඳුනුම්පත් අංකය :- ……………………………………………………………………………

## *3.6* අවසන් කිරීම

**3.6.1 සේවායෝජකයා විසින්**

මෙම 3.6.1 වගන්තියේ (අ) සිට (ඊ) දක්වා ඡේදවල ඇති ඕනෑම සිදුවීමක් සිදු වූ පසු සේවායෝජකයා විසින් සේවා සපයන්නා වෙත සේවය අවසන් කිරීම පිළිබඳ දින 30කට නොඅඩු කාලයක් තුළ ලිඛිත දැනුම් දීමකින් මෙම කොන්ත්‍රාත්තුව අවසන් කළ හැකිය.(ඉ) හි සඳහන් සිදුවීම සම්බන්ධයෙන් දින 60ක් තුළ දැනුම් දිය හැක.

(අ) සේවායෝජකයා විසින් ලිඛිතව අනුමත කර ඇති පරිදි දැනුම් දීමෙන් පසු දින 30ක් ඇතුළත හෝ වෙනත් කාලසීමාවක් තුළ සේවා සපයන්නන් කොන්ත්‍රාත්තුව යටතේ ඔවුන්ගේ වගකීම් ඉටු කිරීමේදි අසමත් වීම

(ආ) සේවා සපයන්නා බංකොලොත් වුවහොත්

(ඇ) Force Majeure හි ප්‍රතිඵලයක් ලෙස, සේවා සපයන්නාට දින 60කට නොඅඩු කාලයක් සඳහා

(ඇ) සේවා සපයන්නා විසින් 4.8 වගන්තියට අනුව කායර් සාධන සුරක්ෂණයක් ලබා නොදෙන්නේ නම්

(ඉ) සේවා සපයන්නා විසින් 3.7.1 උප වගන්තිය සහ කොන්ත්‍රාත් දත්තවලට අනුකූලව උපරිම ඇවර කළ හානිය ගෙවිය හැකි දින ගණනින් සේවා අවසන් කිරීම ප්‍රමාද කර ඇත්නම්

(ඊ) සේවා යෝජකයා තම අභිමතය පරිදි මෙම කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට තීරණය කරන්නේ නම්.

**3.6.2 සේවා සපයන්නා විසින්**

සේවා සපයන්නා විසින් සේවායෝජකයාට දින තිහකට නොඅඩු ලිඛිත දැනුම්දීමකින් මෙම කොන්ත්‍රාත්තුව අවසන් කළ හැකිය,මෙම 3.6.2 වගන්තියේ (අ) හා (ආ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති ඕනෑම සිදුවීමක් සිදු වූ පසු එවැනි දැනුම්දීමක් කළ යුතුය.

(අ) මෙම කොන්ත්‍රාත්තුවට අනුව සේවා සපයන්නාට ගෙවිය යුතු මුදල් ගෙවීමට සේවායෝජකයා අපොහොසත් වන්නේ නම් සහ එම ගෙවීම ප්‍රමාද වී ඇති බවට සේවා සපයන්නාගෙන් ලිඛිත දැනුම්දීමක් ලැබීමෙන් පසු දින 90ක් ඇතුළත 9 වැනි වගන්තියට අනුව ආරවුලකට යටත් නොවේනම්, හෝ

(ආ) Force Majeure හි ප්‍රතිඵලයක් ලෙස, සේවා සපයන්නාට දින 56කට නොඅඩු කාලයක් සඳහා සේවාවන්හි ද්‍රව්‍යමය සැපයීමක් ඉටු කිරීමට නොහැකි වීම.

**3.6.3 අවසන් කිරීම මත ගෙවීම**

3.6.1 හෝ 3.6.2 වගන්තිවලට අනුව මෙම කොන්ත්‍රාත්තුව අවසන් කිරීමෙන් පසු, සේවායෝජකයා විසින් සේවා සපයන්නා වෙත පහත සඳහන් ගෙවීම් කළ යුතුය:

(අ) සේවය අවසන් කිරීමේ දිනට පෙර සතුටුදායක ලෙස ඉටු කරන ලද සේවාවන් සඳහා 7 වන වගන්තිය අනුව කොන්ත්‍රාත් මුදල.

(ආ) 3.6.1 වගන්තියේ අ, ආ, ඇ,ඈ ඡේදවලට අනුව අවසන් කිරීමේ අවස්ථාවක හැර,කොන්ත්‍රාත්තුව කඩිනමින් සහ ක්‍රමානුකූලව අවසන් කිරීම සඳහා කිසියම් සාධාරණ පිරිවැයක් ප්‍රතිපූරණය කිරීම.

## 4. සේවා සපයන්නාගේ වගකීම්

### *4.1* පොදු

සේවා සපයන්නන් සේවායෝජකයාගේ අවශ්‍යතා සහ ක්‍රියාකාරකම් සටහන සලකමින් කඩිසරව , කායර්ක්ෂම සහ ආර්ථිකමය වාසි සහිත ශිල්පීය ක්‍රම භාවිතයෙන් කළමනාකාරිව සුදුසු උසස් තාක්ෂණික සහ ආරක්ෂිත ක්‍රම භාවිත කරමින් සෑම විටම සේවාවන් ඉටු කළ යුතුය.සේවා සපයන්නා, සේවා යෝජකයාගේ උපදේශකයින් ,උප කොන්ත්‍රාත්කරුවන් හෝ ඕනෑම තෙවන පාර් ශවයන් සමඟ විශ්වාසවන්ත හා ගරු කිරීමෙන් යුතුව සේවායෝජකයාගේ නීත්‍යානුකූල අවශ්‍යතා ඉටු කළ යුතුය.

### *4.2* රහස්‍යභාවය

සේවා සපයන්නන්, මෙම කොන්ත්‍රාත්තුව හෝ ඊට අදාළ තොරතුරු සේවායෝජකයාගේ පූර් ව ලිඛිත අවසරයකින් තොරව කොන්ත්‍රාත්තුව කල් පිරී වසර 2ක් ඉකුත් වන තුරු කිසිදු පාර් ශවයකට හෙළි නොකල යුතුය.

### *4.3* සේවා යෝජකයාගේ පූවර් අනුමැතිය අවශ්‍ය සේවා සපයන්නාගේ ක්‍රියාවන්

පහත සඳහන් ඕනෑම ක්‍රියාමාගර්යක් ගැනීමට පෙර සේවා සපයන්නන් විසින්, සේවා යෝජකයාගේ පූර් ව ලිඛිත අනුමැතිය ලබා ගත යුතුය:

(අ) සේවාවේ ඕනෑම කොටසක සේවා සැපයීම සඳහා උප කොන්ත්‍රාත්තුවකට ඇතුලත් වීම

(ආ) ලංසු ආකෘති පත්‍රයේ (III කොටස) අංක 5 යටතේ සඳහන් කායර් මණ්ඩල විස්තරයෙහි (ප්‍රධාන පුද්ගලයින් සහ උප කොන්ත්‍රාත්කරුවන්) නම අනුව ලැයිස්තුගත කර නොමැති පුද්ගලයින්ගේ එවැනි සාමාජිකයන් පත් කිරීම.

(ඇ) ක්‍රියාකාරකම් සටහන වෙනස් කිරීම, සහ

(ඈ) කොන්ත්‍රාත් දත්තවල සඳහන් කර ඇති වෙනත් ක්‍රියාවක්.

### *4.4* වගකීම් වාර් තා කිරීම

සේවා සපයන්නන් විසින් 4 වන කොටසේ අවශ්‍යතා උපලේඛනයේ සඳහන් සියලු කායර්යන් හා වාර්තා සේවායෝජකයා වෙත ඉදිරිපත් කළ යුතුය.

### *4.5* සේවා යෝජකයාගේ දේපළ බවට සේවා සපයන්නන් විසින් සකස් කරන ලද ලේඛන

3.6 වගන්තියට අනුව සේවා සපයන්නන් විසින් ඉදිරිපත් කරන ලද සියලුම වාර් තා සහ උපකරණ (ඇමුණුම II) හැර සේවායෝජකයාගේ දේපළ බවට පත්විය යුතු අතර සේවා සපයන්නන් විසින් මෙම කොන්ත්‍රාත්තුවේ සේවය අවසන් කිරීමට හෝ කල් ඉකුත්වීමට පෙර එවැනි ලේඛන පිලිබඳ සවිස්තරාත්මක ඉන්වෙන්ට්‍රියක් සමඟ සේවා යෝජකයා වෙත ලබා දිය යුතුය.

### *4.6* සේවකයන් යෙදවීම පිළිබඳ කොන්ත්‍රාත්කරුගේ කායර්භාරය

4.6.1 රෝහල්වල පවත්නා පිරිසිදු කිරීමේ අවශ්‍යතාවයන්ට අනුකූලව දින 365ම සේවය සැපයිය යුතු වන හෙයින් යොදා ගනු ලබන සේවක සංඛ්‍යාව සඳහා ශ්‍රම පිරිවැය ගණනය කිරීම සම්පූණර් වෂර්යක් සඳහා ඇතුළත් සෑම දිනයක් ම වෙනුවෙන්ම ගෙවිය යුතු වන වැටුප් දීමනා, අතිකාල හා අමතර ගෙවීම් නිසි පරිදි ඇතුළත් කර ඇත. විශේෂයෙන්ම පෝය නිවාඩු දිනයෙහි හා ප්‍රසිද්ධ නිවාඩු දිනයෙහි අමතර සේවයේ යෙදවීම වෙනුවෙන් පඩිපාලක සභා තීරණයන්හි විධිවිධානයන්ට අනුකූලව ශ්‍රම පිරිවැය ගණනය කර ඇත. එසේම 6වන වැඩ කරන දිනය, කෙටි වැඩ කරන දිනයක් වශයෙන් සළකා අමතර සේවයේ යෙදවීම සඳහා ඇතුළත් කළ යුතු වන අතර සති නිවාඩු දිනය සතියේ ඕනෑම දිනයක සේවකයන්ට ලබාදීමේ හැකියාව පවත්නා හෙයින් එදින සේවකයෙක්ට නිවාඩු ලබාදීම හා එදින සේවා අවශ්‍යතාවය වෙනුවෙන් වෙනත් සේවකයෙකු සේවයේ යෙදවීමේ පදනම මත ගණනය සිදු කළ යුතු වේ.

රෝහල/ආයතනයේ සේවා අවශ්‍යතාවයට අනුව සේවකයන් සැපයීම කොන්ත්‍රාත්කරුගේ වගකීමක් වන අතර අවශ්‍යතා උපලේඛනයේ (IV කොටස) අංක 3 ලැයිස්තුව අනුව ගණනය කර ශ්‍රම පිරිවැය කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කළ යුතු අතර අවම ශ්‍රම පිරිවැය ප්‍රමාණයට අඩුවෙන් ශ්‍රම පිරිවැය සඳහන් කරමින් ඉදිරිපත් කරන ලංසු ප්‍රතිචාරාත්මක නොවන ලංසු සේ සළකා කටයුතු කරනු ලැබේ.

4.6.2 පඩිපාලක සභාවෙන් පිරිසිදු කිරීමේ සේවයට අදාළව කරනු ලබන වැටුප් වැඩි කිරීම අනුව අවස්ථාවෝචිත පරිදි ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය මත කොන්ත්‍රාත් මුදල වැඩි කිරීමට හැකියාව ඇත.

4.6.3 තමාගේ කවර හෝ සේවකයකු විසින් කම්කරු වන්දි ආඥා පණත යටතේ හෝ එහි සම්බන්ධ ව්‍යවස්ථාපිත සංශෝධන, නොහොත් වෙනස්කිරීම් යටතේ හෝ කරනු ලබන ඕනෑම වන්දි ඉල්ලීමක් සම්බන්ධයෙන් පිරිසිදු කිරීමේ සේවා කොන්ත්‍රාත්කරු වගකිව යුතු අතර, ආයතන ප්‍රධානියා හෝ ඔහුගේ බලය පවරන ලද නිලධාරියෙකුගේ උපදෙස් අනුව තම ශ්‍රමිකයන්ට භෞතිකව (කැපීම්, කෙටීම්, තැලීම් ආදී) රසායනික වශයෙන් හෝ ජෛව විද්‍යාත්මකව (ආසාදන, අසාත්මිකතා ආදී) සිදුවිය හැකි අනතුරුවලින් වළක්වා ගැනීමට සියළු පියවර ගැනීම කොන්ත්‍රාත්කරුගේ වගකීම වේ. ඒ සම්බන්ධ කිසිම වගකීමකට **ක්‍ෂය රෝග මර්දන හා ළය රෝග පිළිබඳ ජාතික වැඩසටහන් අධක්ෂක** බැඳී නොසිටියි.

## *4.7 අලාභ හානි, කොන්දේසි කඩ කිරීම් හා අය කිරීම්*

4.7.1 යම් හෙයකින් අවශ්‍යතා උපලේඛනයේ අංක 2 සඳහන් මෙම උපකරණ අවශ්‍ය ප්‍රමාණයන් ආයතනය සතු නොවුනහොත් එම උපකරණ අදාළ රෝහල් හෝ සෞඛ්‍ය ආයතනය විසින් සපයා ගනු ලබන අතර, එම උපකරණ යොදා නොගනිමින් පිරිසිදු කිරීමේ සේවය නිසි ප්‍රමිතියකින් තොරව සිදු කිරීම සඳහා එක් අවස්ථාවක් සඳහා ඇමුණුම II – B මගින් දක්වා ඇති දඩ මුදල අය කල යුතුය.

4.7.2 කාර්යයන් ඉටු කිරීමේ දී කාර්යාලයේ/ආයතනයේ/රෝහලේ සම්පත්වලට, කාර්ය මණ්ඩලයට හානිදායක නොවන අයුරින් සේවය කළ යුතුය. අපරික්ෂාකාරීව, නොසැළකිලිමත්ව කටයුතු කිරීමෙන් හා පුහුණු සේවකයින් නොයෙදවීමෙන් ආයතනයේ දේපලවලට යම් අලාභයක් සිදුවුවහොත් එම දේපලේ වටිනාකම/අළුතෙන් මිලදී ගැනීමට යන වියදම (භාණ්ඩයක් හෝ උපකරණයක වටිනාකම ආයතන ප්‍රධානියා විසින් තීරණය කරනු ඇත.) සහ එම වටිනාකමින් 25%ක අතිරේක මුදලක් අය කරනු ලැබේ.

4.7.3 තෝරාගත් ලංසුකරුගේ සේවා ඉටුකිරීම අසතුටුදායක බව ආයතන ප්‍රධානියාට පෙනී ගියහොත් හෝ කොන්ත්‍රාත්කරු විසින් කොන්ත්‍රාත්තුවේ කුමන හෝ කොන්දේසියක් කඩකර ඇත්නම් හෝ කොන්ත්‍රාත්කරුගේ කාර්ය සාධන බැඳුම්කරයේ හිමිකම අහිමි කිරීමටත්, කොන්ත්‍රාත්තුව අවසන් කිරීමටත්, ආයතන ප්‍රධානියා විසින් නිදේර්ශ සහිතව **ක්ෂය රෝග මර්දන හා ළය රෝග පිළිබඳ ජාතික වැඩසටහන, අධ්‍යක්ෂ** වෙත දැනුම් දිය යුතුයි.

4.7.4 නිල ඇඳුමෙන් සැරසී නොමැති පරීක්ෂක සහ කම්කරුවන් වෙනුවෙන් පහත සඳහන් පරිදි මුදලක් අය කරනු ලැබේ.

I. කොන්ත්‍රාත් ආයතනය විසින් ලබාදිය යුතු ඇඳුමෙන් සැරසී නොසිටීම නිසා එක් අයකු වෙනුවෙන් දිනකට රු.100/- ක් ද යනුවෙනි.

**4.7.5 සේවකයන් සේවයේ නොයෙදවීම සම්බන්ධයෙන් අය කිරීම්.**

I. සේවය සැපයීම වෙනුවෙන් ගෙවීම් කළ යුත්තේ සේවයේ යොදවන සේවකයින් සඳහා පමණී. අඩුවෙන් සපයනු ලබන සෑම සේවකයෙකු වෙනුවෙන්ම දිනකට රු.450.00 ක මුදලක් මාසික බිල්පතින් අය කරගනු ලැබේ.

II. සේවයට වාතර්‍ා කළ යුතු නියමිත වේලාවෙන් පසු ප්‍රමාදවන සෑම පැය භාගයකටම දෛනික වැටුපෙන් 1/18ක මුදලක්, ප්‍රමාද ගාස්තු ලෙස අඩු කරනු ලැබේ. නියමිත රාජකාරී පැය ගණන (පැය 09) සම්පූණර් වූ පසුව අතිකාල ගණනය කරනු ලැබේ.

III. පිරිමි සේවකයන් 20%ක් සැපයිය යුතු අතර ඒසේ නොවන අවස්ථා වලදි අඩුවන ඒක් පිරිමි සේවකයෙක් සඳහා දිනක වැටුප බැගින් අය කර ගනු ලැබේ.

4.7.6 I. පිරිසිදු කිරීමේ සේවා ඉටු කළ යුතු ප්‍රදේශයක දෛනික සේවා සැපයීම දුවර්ල බවට අධීක්ෂණ නිලධාරින් විසින් ආයතන ප්‍රධානියාට වාතර්ා කිරීමෙන් පසු එක් ප්‍රදේශයක් සඳහා දිනකට අවම රු.2,500/- ක් ද, උපරිම රු.5000/- ක් ද වන පරිදි මුදලක් මාසික බිල්පත් මඟින් අඩු කිරීමට ආයතන ප්‍රධානියාට හැකිය.

II. පිරිසිදු කිරිම් නිසියාකාරව ඉටු කිරීම සඳහා IV කොටසේ ඇමුණුම II හි සඳහන් භාණ්ඩ භාවිතා කල යුතු අතර, එම නියමිත උපකරණ පිරිසිදු කිරීම සඳහා භාවිතා නොකරන අවස්ථාවන්හි දී IV කොටසේ ඇමුණුම II – B හි සඳහන් වන දඩ මුදලක් අය කිරීමට ආයතන ප්‍රධානියාට හැකිය.

4.7.7 පිරිසිදු කිරීමේ සේවය නිසි පරිදි ඉටු නොවන්නේ නම්, අදාළ සේවය පිටතින් ඉටු කරවා ගෙන ඒ සඳහා වන වියදම කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගැනීමට ආයතන ප්‍රධානියා විසින් කටයුතු කරනු ලැබේ.

4.7.8 සේවා සැපයීමේ දි IV කොටස ඇමුණුම II අනුව එම උපකරණ භාවිතා කර ලංසු ලියවිලි වල වැඩ සැලසුම, සේවා හා කාර්‍ය සාධන පිරිවිතර වල විෂය පථය යන ලේඛන අනුව ආසාදන පාලන ඒකකයේ හෙද නිලධාරි/ආසාදන පාලන ඒකකය භාර නිලධාරියෙකුට/මහජන සෞඛ්‍ය පරීක්ෂකට හෝ ආයතන ප්‍රධානියා විසින් නම් කරන ලද නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතේ නියමිත ප්‍රමිතිය පවත්වා ගනිමින් සහ නියමිත සටහන් පවත්වා ගනිමින් සේවය සැපයිය යුතුය. ඒසේ නොවන අවස්ථා වලදි 4.7.6 හි I හා II අනුව කටයුතු කරනු ලැබේ. එසේ නොකිරීම වෙනුවෙන් ඒ සඳහා රෝහල/ආයතනයට ඒ වෙනුවෙන් අමතර වියදමක් දැරීමට සිදුවුවහොත් එම මුදල සහ 25% අතිරේක පිරිවැයක්ද අය කිරීමට ආයතන ප්‍රධානියා කටයුතු කරනු ලැබේ.

4.7.9 කොන්ත්‍රාත්කරුගේ සේවාව පිළිබඳව ආයතනයේ කාර්‍ය මණ්ඩලයෙන් සහ මහජනයාගෙන් ලැබෙන පැමිණිලි, පොදු දේපළවලට අලාභ හානි සිදුවීම නිසා අය කිරීම්, නියමිත සේවක සංඛ්‍යා නොයෙදවීම නිසා අය කිරීම සහ පිරිසිදු කිරීමේ සේවකයන්ගේ විනය කඩවීම් වාතර්ා වීම් යනාදිය සැළකිල්ලට ගෙන කොන්ත්‍රාත් ආයතනය වෙත ලබා දී ඇති කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමටත්, කොන්ත්‍රාත් ආයතනය අසාදු ලේඛන ගත කිරීමටත් **ක්ෂය රෝග මර් දන හා ළය රෝග පිළිබඳ ජාතික වැඩසටහන, අධ්‍යක්ෂ** කටයුතු කරනු ලැබේ.

4.7.10 පිරිසිදු කිරීමේ සේවාලාභී ආයතනයට අයත් භූමි භාගය තුළ එම සේවාව පවත්වා ගෙන යන කොන්ත්‍රාත්කරුට තමාගේ බඩු බාහිරාදීය ගබඩා කර තබා ගැනීමට යම්කිසි ස්ථානයක් නැතහොත් කාමරයක් සපයන ලද්දේ නම්, ඊට සපයනු ලබන විදුලි බලය, ජලය හා ගෑස් යන මේවායේ වියදම් වෙනුවෙන් අදාළ ආයතන ප්‍රධානියා විසින් නියම කරන නිශ්චිත මුදලක් මාසිකව කොන්ත්‍රාත්කරු විසින් ගෙවිය යුතු අතර, මේ කොන්ත්‍රාත්තුව අවසන් වූ පසු කිසිම ආරවුලක් නැතිව එම දේපලවල භුක්තිය ආපසු ආයතන ප්‍රධානියා වෙත භාරදිය යුතුය. මාසයකට කලින් දැන්වීමක් කොට ඕනෑම අවස්ථාවක පිරිසිදු කිරීමේ කොන්ත්‍රාත්කරුට එබඳු ස්ථානයකින් ඉවත්වන ලෙස නියම කිරීමට **ක්ෂය රෝග මර් දන හා ළය රෝග පිළිබඳ ජාතික වැඩසටහන, අධ්‍යක්ෂට** /ආයතන ප්‍රධානියාට බලය ඇත.

4.7.11 මේ කොන්ත්‍රාත්තුව යටතේ තමාගේ ඉටුවිය යුතු සේවය ඉෂ්ට කිරීමට පිරිසිදු කිරීමේ සේවා කොන්ත්‍රාත්කරුට මොනයම් හේතුවක් නිසා හෝ නොහැකි වුවහොත් වෙනත් ආයතනයකින් එම සේවාව ඉටුකර ගැනීමට විධිවිධාන යෙදීමටත්, එසේ විධිවිධාන යෙදීමෙන් ආණ්ඩුවට දරන්නට සිදු වූ යම් අතිරේක වියදමක් වේ නම් එම වියදමද නියම කරනු ලබන අතිරේක මුදලක්ද පිරිසිදු කිරීමේ සේවා ආයතනයෙන් අයකර ගැනීමටද ආයතන ප්‍රධානියාට බලය ඇත.

4.7.12 මෙම කොන්ත්‍රාත්තුවට අදාළ යම් කිසි අය කිරීමක් කොන්ත්‍රාත්තුව අවසන් වූ අවස්තාවක දී අය කිරීමට සිදු වුව හොත් කොන්ත්‍රාත්කරුගේ කාර්‍ය සාධන සුරක්ෂණය මඟින් අයකර ගත හැකිය. කාර්‍ය සාධන සුරක්ෂනය ද ගෙවා ඇති අවස්ථාවක කොන්ත්‍රාත්කරු සේවය සපයනු ලබන වෙනත් රෝහලක/ සෞඛ්‍ය ආයතනයක ගිවිසුමකින් එම අයකිරීම සිදුකර ගැනීම සඳහා **ක්ෂය රෝග මර් දන හා ළය රෝග පිළිබඳ ජාතික වැඩසටහන, අධ්‍යක්ෂ** කටයුතු කරනු ලැබේ.

*4.8* කාර්‍ය සාධන සුරක්ෂණය

සේවා සපයන්නා විසින් සේවායෝජකයාට කොන්ත්‍රාත් ලිපියේ දක්වා ඇති දිනට පෙර කාර්‍ය සාධන සුරක්ෂණය ලබා දිය යුතුය.කාර්‍යසාධන සුරක්ෂණය සේවායෝජකයාට පිළිගත හැකි මුදලකින් සහ

ආකෘතියකින් සහ බැංකුවක් හෝ ඇපකරයක් මඟින් නිකුත් කරනු ලැබේ.කායර් සාධන සුරක්ෂණය කොන්ත්‍රාත්තුව අවසන් වූ දින සිට දින 28 දක්වා වලංගු වේ.

4.8.1 ලංසු ප්‍රදානය ලද කොන්ත්‍රාත්කරු, ලංසු පිළිගැනීමේ ලිපිය ඉදිරිපත් කර දින 14ක් ඇතුළත ලංසුවේ කොන්ත්‍රාත් වටිනාකමින් 10%ක් හෝ ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය අනුව දැනුම් දෙනු ලබන වටිනාකමින් යුත් කායර්සාධන බැඳුම්කරයක්, මහ බැංකුව විසින් අනුමත කරන ලද වාණිජ බැංකුවකින් ලබා ගෙන ඉදිරිපත් කල යුතුය.

4.8.2 සුදුසුකම් ලබා ඇති ලංසුකරු තෝරා ගෙන ගිවිසුම අත්සන් කල පසු අනෙකුත් ලංසුකරුවන්ගේ ලංසු බැඳුම්කර නිදහස් කරනු ලැබේ.

4.8.3 සාථර්ක ලංසුකරුට ලිඛිතව දැනුම් දුන් දින සිට දින 14ක් ඇතුළත එයට සාථර්ක ප්‍රතිචාර නොදක්වන ලද්දේ නම් ඊළඟ ලංසුකරුට කොන්ත්‍රාත්තුව ලබාදීම පිළිබඳව සළකා බැලීමට ප්‍රසම්පාදන කමිටුවට බලය ඇත. ලංසු ප්‍රදානය කිරීමෙන් පසුව සාධාරණ හේතු නොමැතිව එය භාරගැනීම ප්‍රතික්ෂේප කරන ලංසුකරුවන් අසාධු ලේඛනයට ඇතුළත් කිරීමට කටයුතු කරන අතර ලංසු ඇපකරය ද රාජසන්තක කරනු ඇත.

## *5. සේවා සපයන්නාගේ විස්තරය*

### 5.1 පිරිස් විස්තරය

සේවා සපයන්නන් විසින් සේවයේ යොදවන වැඩපරීක්ෂකයන් හා කම්කරුවන්ගේ සේවාවන් ක්‍රියාත්මක කිරීමේදි එකඟ වූ රැකියා විස්තර,අවම සුදුසුකම් සහ ඇස්තමේන්තුගත නියැලී සිටින කාලසීමාවන් දැක්විය යුතු අතර .සේවා යෝජකයා විසින් මෙය අනුමත කරනු ලැබේ.ප්‍රධාන පුද්ගලයන්ගේ සේවාවන් ක්‍රියාත්මක කිරීමේදි මාතෘකාව,එකඟ වූ රැකියා විස්තර,අවම සුදුසුකම් සහ ඇස්තමේන්තුගත නියැලී සිටින කාලසීමාවන් ලංසු ආකෘති පත්‍රයේ (III කොටස) අංක 5 ලැයිස්තුවෙහි විස්තර කර ඇත.ප්‍රධාන පුද්ගලයින් සහ උප කොන්ත්‍රාත්තරුවන් මාතෘකාවෙන් මෙන්ම ලංසු ආකෘති පත්‍රයේ (III කොටස) අංක 5 ලැයිස්තුවෙහි නමෙන් ද දක්වා ඇත.සේවා යෝජකයා විසින් මෙය අනුමත කරනු ලැබේ.

### 5.2 පිරිස් ඉවත් කිරීම සහ/හෝ ආදේශ කිරීම

(අ) සේවායෝජකයා වෙනත් ආකාරයකින් එකඟවිය හැකි පරිදි, සේවයේ යොදවන පුද්ගලයින් තුළ කිසිදු වෙනසක් සිදු නොකළ යුතුය. සේවා සපයන්නාගේ සාධාරණ පාලනයෙන් ඔබ්බට කිසියම් හේතුවක් නිසා,එම පුද්ගලයින්ගෙන් කිසිවෙකු ප්‍රතිස්ථාපනය කිරීමට අවශ්‍ය වන්නේ නම්,සේවා සපයන්නා විසින් ආදේශකයන් ලෙස සමාන හෝ වඩා හොඳ සුදුසුකම් ඇති පුද්ගලයෙකු සැපයිය යුතුය.

(ආ) කිසියම් පුද්ගලයෙකු (I)බරපතල විෂමාචාරයක් සිදු කර ඇති බව හෝ අපරාධ ක්‍රියාවක් සිදු කර ඇති බවට චෝදනා එල්ල වී ඇති බව සේවායෝජකයා සොයා ගන්නේනම් හෝ (II) කිසියම් පුද්ගලයෙකුගේ කායර් සාධනය පිළිබඳ සෑහිමකට පත් වීමට සාධාරණ හේතුවක් තිබේ නම්, එවිට සේවා සපයන්නා සේවා යෝජකයාගේ ලිඛිත ඉල්ලීම මත එහි හේතු සඳහන් කරමින්, සේවා යෝජකයාට පිළිගත හැකි සුදුසුකම් සහ පළපුරුද්ද සහිත පුද්ගලයෙකු ආදේශකයකු ලෙස ලබා දිය යුතුය.

(ඇ) පිරිස් ඉවත් කිරීම සහ/හෝ ප්‍රතිස්ථාපනය කිරීම හේතුවෙන් පැන නගින අමතර වියදම් සඳහා සේවා සපයන්නාට හිමිකම් නැත.

## *6. සේවායෝජකයාගේ වගකීම්*

### 6.1 සහය සහ නිදහස් කිරීම්

කොන්ත්‍රාත් කොන්දේසි වල නිශ්චිතව දක්වා ඇති පරිදි සේවා සපයන්නාට රජය විසින් ලබා දිය යුතු සහය සහ නිදහස් කිරීම් ලබා දීම සේවායෝජකයා සහතික කළ යුතුය.

### 6.2 අදාළ නීතිය වෙනස් කිරීම

මෙම කොන්ත්‍රාත්තුවේ දිනයෙන් පසුව,සේවා සපයන්නා විසින් සපයනු ලබන සේවාවන්හි පිරිවැය වැඩි කරන හෝ අඩු කරන බදු සහ තීරුබදු සම්බන්ධයෙන් අදාළ නීතියේ යම් වෙනසක් තිබේ නම් හෝ එසේ නොමැති නම් සේවා සපයන්නාට ගෙවිය යුතු වේතනය සහ ප්‍රතිපූරණය කළ හැකි වියදම් මෙම

කොන්ත්‍රාත්තුව යටතේ පාශර්වයන් අතර එකඟතාවය අනුව වැඩි කිරීම හෝ අඩු කිරීම සිදු කළ යුතු අතර 7.2 වගන්තියේ සඳහන් වන ප්‍රමාණයට අනුරූප ගැලපීම් සිදු කරනු ලැබේ.

**6.3 සේවා සහ පහසුකම**

සේවායෝජකයා විසින් ලැයිස්තුගත කර ඇති සේවා සහ පහසුකම් සේවා සපයන්නා වෙත ලබා දිය යුතුය.

## *7. සේවා සපයන්නා වෙත ගෙවීම්*

**7.1 එකවර ගෙවීම**

සේවා සපයන්නාගේ වේතනය කොන්ත්‍රාත්තුවේ මිල නොඉක්මවිය යුතු අතර සියලුම පිරිවැය, විස්තර කර ඇති සේවාවන් ඉටු කිරීමේදි සේවා සපයන්නන් විසින් දරනු ලබන අනෙකුත් සියලුම වියදම් ඇතුළුව ස්ථාවර එකතුවක් විය යුතුය.

**7.2 කොන්ත්‍රාත් මිල**

කොන්ත්‍රාත්තුවේ මිල කොන්ත්‍රාත්තුවේ දත්තවල දක්වා ඇත.

**7.3 ගෙවීම පිළිබඳ නියමයන් සහ කොන්දේසි**

සේවා සපයන්නාට ගෙවීම් කරනු ලබන කොන්ත්‍රාත් දත්තවල සඳහන් ගෙවීම් කාලසටහන අනුව කොන්ත්‍රාත් දත්ත වෙනත් ආකාරයකින් දක්වා නොමැති නම්,එම මුදලටම බැංකු ඇපකරයක සේවා සපයන්නා විසින් ප්‍රතිපාදන වලට එරෙහිව පළමු ගෙවීම සිදු කරනු ලැබේ. එය කොන්ත්‍රාත් දත්තවල දක්වා ඇති කාලසීමාව සඳහා වලංගු වේ.එවැනි ගෙවීමක් සඳහා කොන්දේසි සපුරාලීමෙන් පසුව වෙනත් ඕනෑම ගෙවීමක් සිදු කළ යුතු අතර, සේවා සපයන්නා විසින් ගෙවිය යුතු මුදල සඳහන් කරමින් සේවායෝජකයා වෙත ඉන්වොයිසයක් ඉදිරිපත් කළ යුතුය.

## *8. ලංසුකරුවන්ගේ මාසික බිල්පත් නිරවුල් කිරීමේදි සළකා බලන කරුණු*

8.1 බිල්පත් සමඟ මාසික පැමිණීමේ වාර්තා (චෙක්රෝල්) ආයතන ප්‍රධානියාට එවිය යුතුය.

8.2 අදාළ රෝහලෙහි/ආයතනයෙහි සෑම අංශයකම වැඩ කටයුතු සාථර්ක අන්දමින් ඉටුකර තිබෙන බවට ආයතන ප්‍රධානියා විසින් බලය පවරන ලද නිලධාරියෙකු සහතික කල යුතුය.

8.3 නියමිත ප්‍රමිතියෙන් යුත් උපකරණ භාවිතා කරන බවට ආසාදන පාලන ඒකකයේ ප්‍රධානියාගෙන් හෝ ආයතන ප්‍රධානියා විසින් බලය පවරන ලද නිලධාරියකුගෙන් ලබාගත් සහතිකය.

8.4 සෑම මසකම 10 වැනි දිනට පෙර ඊට කලින් මාසයට අදාළ බිල්පත් ගෙවීම් බලධාරියා වෙත ඉදිරිපත් කළ යුතුවීම. බිල්පත ලබාදී දින 90ක් ඇතුළත ගෙවීම් සිදු කරනු ලබයි. (මෙකී දිනට පසුව ඉදිරිපත් කෙරෙන බිල්පත් ගෙවීම් සම්බන්ධයෙන් ඇති වන ප්‍රමාදයන් සම්බන්ධයෙන් රෝහල් හෝ ආයතන ප්‍රධානීන් වගකීමට බැඳී නොසිටියි.).

8.5 සේවා සඳහා තෝරා ගත් ලංසුකරු හෝ ඔහුගේ සේවකයින් විසින් සේවා සපයනු ලබන ආයතනයට සේවා සැපයීමට අදාළව ගෙවීමට සිදුවන යම් මුදලක් වේ නම්, එම මුදල සේවා සැපයුම්කරු වෙත ගෙවීමට ඇති නියමිත මුදලින් අඩු කර ගැනීමට සේවා ලබන ආයතන ප්‍රධානියාට බලය ඇත.

8.6 එක් එක් රෝහල/ආයතනය සඳහා ලංසුකරුවන් විසින් ඉදිරිපත් කරනු ලබන වාෂරීක පොදු කායර්ය පිරිවැය ප්‍රතිශතය මුළු ශ්‍රම පිරිවැයෙන් 10% නොඉක්මවිය යුතු වේ. පොදුකායර්ය පිරිවැය සඳහා ගෙවීම් සිදු කිරීමේදි සේවක සංඛ්‍යාවේ පැමිණීමේ ප්‍රතිශතය අවම වශයෙන් 90% ක් වත් නොමැති නම් වැඩ කරන සත්‍ය සේවක අනුපාතය මත පොදුකායර්ය පිරිවැයෙහි අනුපාතික ප්‍රමාණය ගණනය කර ඒ සඳහා ගෙවීම් සිදු කිරීමට රෝහල/ආයතනය මඟින් කටයුතු කරනු ලැබේ. පොදු කායර් පිරිවැය ගෙවීමේදි ඒ ඒ අයිතම සඳහා අදාළ ලේඛන ලබා ගැනීමට කටයුතු කල යුතුය .

## *9. ආරවුල් විසඳීම*

**9.1 සුහද විසඳුම්**

මෙම කොන්ත්‍රාත්තුව හෝ එහි අථර් නිරූපණය සම්බන්ධයෙන් පැන නගින සියලුම ආරවුල් සාමකාමීව විසඳා ගැනීමට පාශර්වයන් තම උපරිම උත්සාහය භාවිතා කළ යුතුය.

**9.2 ආරවුල් විසදීම**

සේවා යෝජකයා සහ සේවා සපයන්නා අතර කොන්ත්‍රාත්තුව හෝ සේවා සැපයීම සම්බන්ධයෙන් පැන නගින ඕනෑම ආරවුලක් සේවා ක්‍රියාත්මක කිරීමේදි හෝ ඒවා අවසන් වූ පසුවද 1995 අංක 11 දරන බේරුම්කරණ පනතට අනුකූලව විසඳනු ලැබේ.

## *10. පොදු කොන්දේසි*

10.1 පිරිසිදු කිරීමේ කොන්ත්‍රාත්කරු වෙත භාරදිය යුතු සියළුම දැන්වීම් එවීම පිණිස පිරිසිදු කිරීමේ සේවය නමින් තෝරා ගන්නා ස්ථානය වන කොන්ත්‍රාත් දත්ත 1.4හි සඳහන් සේවා සපයන්නාගේ යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් දන්වා යැවුවහොත් ඒවා ඔහුට විධිමත් පරිදි භාරදුන්නා සේ සලකනු ලැබේ. ඉදින් පිරිසිදු කිරීමේ සේවය තම ලිපිනය වෙනස් කළහොත් ඒ බැව් වහාම ක්ෂය රෝග මර් දන හා ළය රෝග පිළිබද ජාතික වැඩසටහන, අධ්‍යක්ෂට හා ආයතන ප්‍රධානියාට දැන්විය යුතුය. (කොන්ත්‍රාත් කාල සීමාව තුළ කොන්ත්‍රාත් ආයතනයේ නම වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.)

10.2 පිරිසිදු කිරීමේ සේවය සම්බන්ධයෙන් කිසියම් ගැටළුවක් මතු වූ විට පිරිසිදු කිරීමේ ආයතනය විසින් ඒ බව ලිඛිත ව හෝ වාචිකව **ක්ෂය රෝග මර් දන හා ළය රෝග පිළිබද ජාතික වැඩසටහන, අධ්‍යක්ෂ** වෙත හෝ බලය පවරා ඇති නිලධාරියෙකුට දැන්විය යුතුය.

10.3 ඉහත කොන්දේසිවලින් ආවරණය නොවුන යම් කරුණක් වේ නම් එය සම්බන්ධයෙන් අවසන් තීරණය **ක්ෂය රෝග මර් දන හා ළය රෝග පිළිබද ජාතික වැඩසටහන, අධ්‍යක්ෂ** සතුය.

# VI කොටස - කොන්ත්‍රාත් දත්ත

පහත සඳහන් කොන්ත්‍රාත් දත්ත,කොන්ත්‍රාත් කොන්දේසි සඳහා අතිරේකයක්/උපලේඛනයක් ලෙස ගත යුතුය.මෙය කොන්ත්‍රාත් කොන්දේසිවලට වඩා බලාත්මක වේ.

| කොන්ත්‍රාත් කොන්දේසි වගන්තිය | විස්තරය | දත්තය |
|---|---|---|
| 1.1 (ඇ) | කොන්ත්‍රාත්තුවේ නම | |
| 1.1 (ඉ) | සේවායෝජකයාගේ නම | |
| 1.3(උ) | සේවා සපයන්නාගේ නම | |
| 1.4 | • සේවායෝජකයාගේ<br>නම:<br>ලිපිනය:<br>ෆැක්ස් අංකය:<br>විද්‍යුත් තැපැල් ලිපිනය:<br>• සේවා සපයන්නාගේ<br>නම:<br>ලිපිනය:<br>ෆැක්ස් අංකය:<br>විද්‍යුත් තැපැල් ලිපිනය: | |
| 1.6 | බලයලත් නියෝජිතයන්ගේ නම්<br>1. සේවා යෝජකයා සඳහා<br>2.සේවා සපයන්නා සඳහා | |
| 3.1 | කොන්ත්‍රාත්තුව බලාත්මක දිනය | |
| 3.3 | කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට අපේක්ෂිත දිනය | |
| 7.2 | සේවායෝජකයා විසින් ලබා දිය හැකි ඕනෑම ආධාරයක් හෝ නිදහස් කිරීමක් ඇත්නම් ඒවාද ඇතුළත් මුළු කොන්ත්‍රාත් වටිනාකම | |
| 4.10 | කාර්යසාධන සුරක්ෂණය | |

# VII කොටස

## කොන්ත්‍රාත් ආකෘති පත්‍ර

1. කොන්ත්‍රාත් ගිවිසුම
2. කාර් ය  සාධන සුරක්ෂණය
3. ලංසු දැන්වීම
4. කොන්ත්‍රාත් ප්‍රදාන ලිපියේ ආකෘතිය

## 1. පිරිසිදු කිරීමේ සේවය සැපයීම සඳහා වූ කොන්ත්‍රාත් ගිවිසුම

**පෞද්ගලික ව්‍යාපාරිකයින් සඳහා**

(අ) පළමු පාශර්වයට මින්මතු කොන්ත්‍රාත්කරු යැයි කියනු ලබන (පෞද්ගලික ලිපිනය) ……………………………………………………………………………………………………………ලිපිනයේ පදිංචි (ආයතනයේ ලිපිනය) ……………………………………………………………………………………………...
ස්ථානයේ තම ව්‍යාපාරික කායර්ාලය පවත්වා ගෙන යනු ලබන (කොන්ත්‍රාත්කරුගේ සම්පූර් න නම) ……………………………………………………………………………………………………………
කොන්ත්‍රාත්කරු යන පාඨයෙන් එකී(කොන්ත්‍රාත්කරුගේ සම්පූණර් නම) ………………………………………………………………………………………………………… ද (ඔහුගේ උරුමක්කාර, පොල්මක්කාර, අද්මිනිස්ත්‍රාසිකාරයන්ද, හවුල් අයිතිකාරයන්ද අදහස් කෙරෙන අතර එම පාඨයට ඒ සියළු දෙනාම ඇතුළත් වන්නාහ) ද

**සීමාසහිත පෞද්ගලික සමාගම් සඳහා,**

(ආ) එක් පාශර්වයකට මින්මතු කොන්ත්‍රාත්කරු යයි කියනු ලබන 2007 අංක 7 දරණ සමාගම් පනතේ විධිවිධාන ප්‍රකාරව ……………………………………………… යටතේ ලියාපදිංචි කරන ලද (ආයතනයේ ලිපිනය) …………………………………………………………… ලිපිනය දරණ ස්ථානයේ තම ව්‍යාපාරික කටයුතු පවත්වා ගෙන යනු ලබන (ආයතනයේ නම) …………………………………………………………… (කොන්ත්‍රාත්කරු යන පාඨයෙන් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වරින් වර පත්වන අධ්‍යක්ෂවරු ද අදහස් කෙරෙන අතර, ඒ පාඨයට ඒ සියළු දෙනාම ඇතුළත් වන්නාහ) ද
මෙහි මින්මතු දෙවන පාශර්වය යැයි කියනු ලබන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශ ලේකම්වන ( සම්පූණර් නම ) ……………………………………………………………………………(සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශ ලේකම් යන පාඨයෙන් සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම් ද එම ධූරයට පත්වන අනුප්‍රාප්තිකයෙක් හෝ අනුප්‍රාප්තිකයෝද ක්ෂය රෝග මර් දන හා ළය රෝග පිළිබඳ ජාතික වැඩසටහන් අධක්ෂකගේ බලය පැවරූ යම් නිලධාරියෙක්ද, සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ පාලනය වන රෝහල් හා ආයතනවල ප්‍රධානීන්ද ඔවුන් විසින් බලය පැවරූ සියළුම නිලධාරීන්ද අදහස් කරන අතර, ඒ පාඨයට සියලු දෙනාම ඇතුළත් වන්නාහ.)
2024 පිරිසිදු කිරීමේ සේවය සැපයීමට අදාළ ලංසු අයදුම්පතට අනුව, ……………………………… පිරිසිදු කිරීමේ සේවය සැපයීම සඳහා ……………………… දිනැති ලිපිය මඟින් පළමු පාශර්වය වෙත ලංසුව ප්‍රදානය කළ බවද , එකී ලංසු ප්‍රදානය කිරීමේ ලිපිය මෙම ගිවිසුමේ කොටසක් ලෙස සැළකිය යුතු බවටද,
ඉහත කොන්ත්‍රාත්කරු යැයි කියනු ලබන ( කොන්ත්‍රාත්කරුගේ නම හෝ ආයතනයේ නම ) …………………………………………… දෙවන පාශර්වය යැයි කියනු ලබන (සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ ක්ෂය රෝග මර් දන හා ළයරෝග පිළිබඳ ජාතික වැඩසටහනේ අධ්‍යක්ෂකගේ නම) …………………………………………………, සෞඛ්‍ය අමාත්‍යාංශය, 385,"සුවසිරිපාය", පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10 යන ලිපිනයෙහි වූ සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ (සේවා ලබන ආයතනයේ/රෝහලේ නම) ………………………………………………………………………………… පිරි සිදු කිරීමේ සේවය සැපයීම සඳහා ඒ වෙනුවෙන් සේවයේ යොදවනු ලබන දිනකට පැය 09 වැඩ පරීක්ෂකවරුන් ………….. ක් ද, දිනකට පැය 09 කම්කරුවන් ……………… ක් ද නියමිතවැඩ පරීක්ෂකයින් සඳහා (පැය 09) සම්පූණර් වාෂර්ික වියදම (දින 365) …………………………………………ක් ද නියමිත කම්කරුවන් සඳහා (පැය 09) සම්පූණර් වාෂර්ික වියදම (දින 365)…………………………………………ක් ද යටත්ව වැඩ පරීක්ෂකයින් සඳහා වාෂර්ික අතිකාල පැය …………….. ක් ද කම්කරුවන් සඳහා වාෂර්ික අතිකාල පැය ………………. ක් ද, පැය 09 නියමිත වැඩ පරීක්ෂකයින් සඳහා අතිකාල වියදම (වාෂර්ික) (දින 365) ………………….ක් ද, , පැය 09ක කම්කරුවෙකු සඳහා අතිකාල වියදම (වාෂර්ික) (දින 365) ……………….ක් ද, වැටුප් සහ අතිකාල සඳහා මුළු වියදම වූ ……………………………………ක් ද,පොදු කායර්ය පිරිවැය සඳහා ……………………………………..ක් ද වශයෙන් වාෂර්ික මුළු පිරිවැය රු. ………………………………………ක (බදු රහිත) පිරිවැයකට ද නීතිමය ප්‍රතිපාදනයක් මඟින් වැඩි විය හැකි ශ්‍රම පිරිවැය හැර වෙනත් කිසිම වියදමක් ……………………………… දින සිට ……………………………… දින දක්වා වූ කාලය තුල වැඩි නොකිරීමට එකඟව ඉහත ආයතනයට පිරිසිදු කිරීමේ සේවය සැපයීමට බැඳී සිටියි.

ඉහත සඳහන් ගිවිසුම ……………………… දින සිට ……………………… දින දක්වා වූ කාලය කොන්ත්‍රාත්තුවේ ගිවිසුම් කාල පරිච්ඡේදය ලෙස සලකනු ලබන බවටද ……………………… දින සිට කොන්ත්‍රාත්වේ ගිවිසුම් කාලය දීඝර් නොකරනු ලැබුවහොත් හෝ සාධාරණ හා නීත්‍යානුකූල හේතූන් මත අවසන් කරනු ලැබුවහොත් සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශ ලේකම් හා කොන්ත්‍රාත්කරු අතර ගිවිසුම අවසන් වූ සේ සළකා කටයුතු කිරීමට ඉහත දෙපාශර්වය බැඳී සිටියි. තවද රු. ……………………………………ක් වූ කායර් සාධන බැඳුම්කරයකට බැඳී සිටියි.

## ගිවිසුම් ගත වන කොන්දේසි.

01. පහත සඳහන් ලේඛන මෙම ගිවිසුමට අයත් නීත්‍යානුකූල ලේඛන ලෙස පිළිගන්නා බවට ද,

a. කොන්ත්‍රාත් ප්‍රදාන ලිපිය
b. කොන්ත්‍රාත්තුව පිළිගැනීමේ ලිපිය
c. කායර්සාධන සුරක්ෂණය
d. ලංසු අයදුම් පත්‍රය
e. ලංසුකරුගේ ප්‍රකාශය
f. ලංසු කොන්දේසි
g. වාෂර්ක පිරිවැය ලේඛනය
h. සේවා සැපයිය යුතු ස්ථාන
i කොන්ත්‍රාත් කාලය තුළ පිරිසිදු කිරීමේ සේවා සඳහා වාෂර්කව සපයා ගත යුතු උපකරණ ලැයිස්තුව
j. පිරිසිදු කිරීමේ සේවාව සඳහා ලංසුකරුවන් විසින් ඉදිරිපත් කළ යුතු අවම වාෂර්ක පිරිවැය පිළිබඳ තොරතුරු වාතර්ාව
k. කොන්ත්‍රාත් කොන්දේසි
l. කොන්ත්‍රාත් දත්ත

02. තෝරා ගත් ලංසුකරුගේ සේවා ඉටු කිරීම අසතුටුදායක බව **ක්ෂය රෝග මර් දන හා ළය රෝග පිළිබද ජාතික වැඩසටහන, අධ්‍යක්ෂට** පෙනී ගියහොත් හෝ කොන්ත්‍රාත්කරු විසින් කොන්ත්‍රාත්තුවේ කුමන හෝ කොන්දේසියක් කඩකර ඇත්නම් ඔහුට එම කායර්සාධන බැඳුම්කරයේ හිමිකම අහිමි කිරීමට ද, තවද කොන්ත්‍රාත්තුව ද අවසන් කිරීමට ද, කොන්ත්‍රාත්කරු අසාධු ලේඛනගත කිරීමටද, **ක්ෂය රෝග මර් දන හා ළය රෝග පිළිබද ජාතික වැඩසටහන, අධ්‍යක්ෂට** බලය ඇති බවද, කොන්ත්‍රාත්කරු එයට යටත් වන බවද, එයට අනුකූලව ක්‍රියා කිරීමට බැඳී සිටින බවට ද,

03. එසේම පිරිසිදු කිරිමේ සේවාවට අයහපත් ලෙස බලපාන වෙනත් කරුණක් අනුව, කොන්ත්‍රාත්තුව කඩකිරීම් සම්බන්ධයෙන් ගනු ලබන වෙනත් ප්‍රතිකමර්යකට අගතියක් නොවන අයුරින් කොන්ත්‍රාත්තුව මුළුමනින්ම හෝ එහි කොටසක් වශයෙන් හෝ අවසන් කිරීමටත් **ක්ෂය රෝග මර් දන හා ළය රෝග පිළිබද ජාතික වැඩසටහන, අධ්‍යක්ෂට** බලය ඇති බවද,

04. නව කොන්ත්‍රාත්කරුවෙක් තෝරා ගන්නා තෙක් අවශ්‍ය වන්නේ නම් **සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ** එකඟතාවය ඇතිව අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවට සේවයේ නියුතු කොන්ත්‍රාත්කරුගේ ගිවිසුමේ නියම කර ඇති කොන්ත්‍රාත් කාල සීමාව දීඝර් කිරීමට බලය ඇත. එසේ කොන්ත්‍රාත්තුව දීඝර් කොට සේවයේ නිරත කරවනු ලබන කොන්ත්‍රාත්කරු මෙම ගිවිසුමට අනුකූලව තම සේවා කටයුතු පවත්වා ගෙන යාමට බැඳී සිටින බවද,

05. කොන්ත්‍රාත්කරුවන් කොන්ත්‍රාත්තුවේ කොන්දේසි පිළිබඳව මනා අවබෝධයක් ලබාගත යුතු බවද, තොරතුරු නොදැන සිටීම සම්බන්ධයෙන් කරනු ලබන කිසිදු ඉල්ලීමක් පිළිගනු ලැබීමට **ක්ෂය රෝග මර් දන හා ළය රෝග පිළිබද ජාතික වැඩසටහන, අධ්‍යක්ෂට** බැඳී නොසිටින බවද,

06. තවද ලංසු අයදුම් පත්‍රයේ සඳහන් පිරිසිදු කිරීමේ සේවාවන් වෙනත් ආකාරයකින් ලබා ගැනීම පිණිස වෙනත් වැඩ පිළිවෙලක් යෙදීම වඩා යෝග්‍යයැයි සිතන්නේ නම් මෙම ගිවිසුම නොසළකා එසේ කිරීමට **ක්ෂය රෝග මර් දන හා ළය රෝග පිළිබද ජාතික වැඩසටහන, අධ්‍යක්ෂ** බලය ඇති අතර, මෙවැනි අවස්ථාවලදී **ක්ෂය රෝග මර් දන හා ළය රෝග පිළිබද ජාතික වැඩසටහන, අධ්‍යක්ෂ** වෙතින් අලාභ ඉල්ලා සිටීමට කොන්ත්‍රාත්කරුට අයිතියක් නොමැති බව කොන්ත්‍රාත්කරු පිළිගත යුතු බවද,

07. එසේම පිරිසිදු කිරීමේ සේවා කරගෙන යාමේදී කොන්ත්‍රාත්කරුගේ නිලධාරින් විසින් කරනු ලබන අධීක්ෂණ කටයුතුවලට අමතරව පිරිසිදු කිරීමේ රාජකාරී ඉටුකිරීම පිළිබඳව අවශ්‍ය යැයි අදහස් කරන ඕනෑම අවස්ථාවකදී **ක්ෂය රෝග මර්දන හා ළය රෝග පිළිබඳ ජාතික වැඩසටහන, අධ්‍යක්ෂ** විසින් අධීක්ෂණ කරනු ලබන බවද,

08. දේශීය ආදායම් දෙපාතර්මේන්තුව විසින් නිකුත් කරනු ලබන රෙගුලාසි මත ගෙවිය යුතු වන බදු ගෙවීමට කොන්ත්‍රාත්කරු යටත් වන බවද,

09. කොන්ත්‍රාත්කරු විසින් ආයතනයේ පිරිසිදු කිරීමේ කායර්යෙහි නියුක්ත සියළුම කම්කරුවන්ගේ සහ පරීක්ෂණ නිලධාරින්ගේ සේවයට පැමිණීම හා පිටවීම අත්සන් කිරීමට ලේඛනයක් සහ එම මාසය තුල සේවය කරන ලද සේවකයින්ගේ මුළු සේවා දින ගණන ඇතුළත් වන පරිදි ලේඛනයක් (චෙක් රෝල්ක්) පවත්වා ගෙන යායුතු වන අතර, මාසික බිල්පත් ඉදිරිපත් කිරීමේ දී බිල්පත් සමඟ අදාළ මාසයේ පැමිණීමේ වාතර්ාව (චෙක් රෝල) ආයතන ප්‍රධානීන්ට එවිය යුතුය.

10. මෙම ලංසුවට අදාළ ගෙවීම් සිදුකරනු ලබන්නේ පවරා ඇති සෑම අංශයකම වැඩ කටයුතු සතුටුදායක අන්දමින් ඉටුකර තිබෙන බවට අදාළ නිලධාරින් හා භාර ගැනීමේ කමිටුව (Acceptance committee) සහතික කිරීමෙන් පසුව ලංසුකරු ගෙවීම් ලේඛන ඉදිරිපත් කිරීමෙන් පසුව බවද,

11. දිනපතා එක් එක් වැඩ මුරය ආරම්භ කිරීමට ප්‍රථම එම වැඩ මුරය සඳහා එක් එක් ස්ථානයේ සේවයේ යොදවනු ලබන පිරිසිදු කිරීමේ කායර් මණ්ඩලයේ නම් ලැයිස්තුවක් හා ඔවුන්ගේ හැඳුනුම්පත් අංක ආයතන ප්‍රධානියා වෙත ඉදිරිපත් කළ යුතු බවද,

12. කොන්ත්‍රාත්කරුගෙන් අය කිරීම්.

12.1 නිල ඇඳුමෙන් සැරසී නොමැති පරීක්ෂක සහ කම්කරුවන් වෙනුවෙන් පහත සඳහන් පරිදි මුදලක් අය කරනු ලැබේ.

I. කොන්ත්‍රාත් ආයතනය විසින් ලබාදිය යුතු ඇඳුමෙන් සැරසී නොසිටීම නිසා එක් අයකු වෙනුවෙන් දිනකට රු.100/- ක් ද යනුවෙනි.

12.2සේවකයන් සේවයේ නොයෙදවීම සම්බන්ධයෙන් අය කිරීම්.

I. සේවය සැපයීම වෙනුවෙන් ගෙවීම් කළ යුත්තේ සේවයේ යොදවන සේවකයින් සඳහා පමණි. අඩුවෙන් සපයනු ලබන සෑම සේවකයෙකු වෙනුවෙන්ම දිනකට  රු.450.00 ක මුදලක් මාසික බිල්පතින් අය කරගනු ලැබේ.

II. සේවයට වාතර්ා කළ යුතු නියමිත වේලාවෙන් පසු ප්‍රමාද වන සෑම පැය භාගයකටම දෛනික වැටුපෙන් 1/18ක මුදලක්, ප්‍රමාද ගාස්තු ලෙස අඩු කරගනු ලැබේ. නියමිත රාජකාරී පැය ගණන (පැය 09) සම්පූණර් වූ පසුව අතිකාල ගණනය කරනු ලැබේ.

III. පිරිමි සේවකයන් 20%ක් සැපයිය යුතු අතර ඒසේ නොවන අවස්ථා වලදී අඩුවන ඒක් පිරිමි සේවකයෙක් සඳහා දිනක වැටුප බැගින් අය කර ගනු ලැබේ.

12.3 I. පිරිසිදු කිරීමේ සේවා ඉටු කළ යුතු ප්‍රදේශයක දෛනික සේවා සැපයීම දුවර්ල බවට අධීක්ෂණ නිලධාරින් විසින් ආයතන ප්‍රධානියාට වාතර්ා කිරීමෙන් පසු එක් ප්‍රදේශයක් සඳහා දිනකට අවම රු.2,500/- ක් ද, උපරිම රු.5,000/- ක් ද වන පරිදි මුදලක් මාසික බිල්පත් මඟින් අය කරගැනීමට ආයතන ප්‍රධානියාට හැකිය.

II. පිරිසිදු කිරීම් නිසියාකාරව ඉටු කිරීම සඳහා ඇමුණුම II හි සඳහන් භාණ්ඩ භාවිතා කල යුතු අතර, ඒම නියමිත උපකරණ පිරිසිදු කිරීම සඳහා භාවිතා නොකරන අවස්ථාවන්හි දී එක් අවස්ථාවකට ඒ සඳහා ඇමුණුම II – B දක්වා ඇති පරිදි දඩ මුදලක් අය කිරීමට ආයතන ප්‍රධානියාට හැකිය.

12.4 පිරිසිදු කිරීමේ සේවය නිසිපරිදි ඉටු නොවන්නේ නම්, අදාළ සේවය පිටතින් ඉටු කරවා ගෙන ඒ සඳහා වන වියදම කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගැනීමට ආයතන ප්‍රධානියා විසින් කටයුතු කරනු ලැබේ.

12.5 මෙම කොන්ත්‍රාත්තුවට අදාළ යම් කිසි අය කිරීමක් කොන්ත්‍රාත්තුව අවසන් වූ අවස්තාවක දී අය කිරීමට සිදු වුව හොත් කොන්ත්‍රාත්කරුගේ කායර් සාධන සුරක්ෂණය මඟින් අයකර ගත හැකිය. කායර් සාධන සුරක්ෂනය ද ගෙවා ඇති අවස්ථාවක කොන්ත්‍රාත්කරු සේවය සපයනු ලබන වෙනත් රෝහලක/ සෞඛ්‍ය ආයතනයක ගිවිසුමකින් එම අයකිරීම සිදුකර ගැනීම සඳහා **ක්ෂය රෝග මර්දන හා ළය රෝග පිළිබඳ ජාතික වැඩසටහන, අධ්‍යක්ෂ** කටයුතු කරනු ලැබේ.

13. තවද පළමු පාශර්වය විසින් මින්මතු එකී ප්‍රසම්පාදන කොන්දේසි සහ ලංසු ප්‍රදානයේ සියළුම නියමයන් හා කොන්දේසිවලට අනුකූලව ක්‍රියා කිරීමට බැඳී සිටින බවටද, ප්‍රසම්පාදන කොන්දේසි මෙම ගිවිසුමේ කොටසක් ලෙස සැලකිය යුතු බව දෙපාශර්වය විසින් පිළිගනී. තවද ලංසු ප්‍රදානයේ සඳහන් කර ඇති පරිදි අදාළ කායර්සාධන ඇපකරය නියමිත කාලය තුලදී (දින 10 ඇතුළත) ඉදිරිපත් කළ යුතු අතර, එය නියමිත කාල සීමාව තුලදී ඉදිරිපත් නොකොට ලංසු ප්‍රදානයේ දින සිට අදාළ සේවා සැපයීම් සිදු කර ඇති විටකදී ඊට අදාළ ගෙවීම් දෙවන පාශර්වය විසින් සිදු කෙරෙනුයේ අදාළ කායර් සාධන ඇපකරය ඉදිරිපත් කිරීමෙන් අනතුරුව බව පළමු පාශර්වය පිළිගත යුතු බවද,

14. ප්‍රසම්පාදන කොන්දේසි හා ගිවිසුම් අතර යම් ගැටළුවක් පැන නැඟුනහොත් එහි දී මෙම ගිවිසුම බලපැවැත්වෙන බවටද,

15. ඉහත කී රෙගුලාසිවලට අමතරව ප්‍රසම්පාදන කමිටුව විසින් හෝ අභියාචනා සළකා බලන අවස්ථාවේ දී ප්‍රසම්පාදන අභියාචන කමිටුව විසින් පනවනු ලබන කොන්දේසි ගිවිසුමෙහි කොටසක් ලෙස පිළිගැනෙන අතර එම කොන්දේසිවලට කොන්ත්‍රාත්කරු බැඳී සිටිය යුතු බවද, ඉහත කී රෙගුලාසිවලට අමතරව ක්‍රියාත්මක විය යුතු රෙගුලාසි ක්ෂය රෝග මර් දන හා ළය රෝග පිළිබඳ ජාතික වැඩසටහන, අධ්‍යක්ෂ විසින් වරින්වර නිකුත් කරනු ලබන අතර එකී රෙගුලාසි පිළිපැදීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටිය යුතු බවටද,

16. මෙහි සඳහන් කොට ඇත්තා වු කොන්දේසිවලින් ආවරණය නොවුන යම් කරුණක් වේ නම් එය ක්ෂය රෝග මර් දන හා ළය රෝග පිළිබඳ ජාතික වැඩසටහන, අධ්‍යක්ෂගේ අභිමතය පරිදි තීරණය වන බවටද, ඉහත කොන්ත්‍රාත් ගිවිසුමේ සඳහන් සියළුම උපදෙස් හා කොන්දේසි කියවා තේරුම් ගෙන එම කොන්දේසි පරිපූණර්ව හා නොඅඩුව ඉටු කරන බවට එකඟව හා බැඳී දෙපාශර්වය එයට 2025…………………. දින "මහජන සෞඛ්‍ය සංකීර් නයේ දී" අත්සන් තබන ලදී.

………………………………………………………………

ක්ෂය රෝග මර් දන හා ළය රෝග පිළිබඳ ජාතික වැඩසටහන, අධ්‍යක්ෂ ,

………………………………………………………………

ආයතනයේ අයිතිකරු/ අයිතිකරුවන් වෙනුවෙන් සමාගමේ කළමණාකාර

(නිල මුද්‍රාව)

සාක්ෂිකරු 01.

නම - ………………………………………………………………

ලිපිනය -………………………………………………………………

ජාතික හැඳුනුම්පත් අංකය - ………………………………………

අත්සන - ………………………………………………………………

රූ

සාක්ෂිකරු 02.

නම - ………………………………………………………………

ලිපිනය -………………………………………………………………

ජාතික හැඳුනුම්පත් අංකය - ………………………………………

අත්සන - ………………………………………………………………

ACCEPTABLE FORMAT FOR PERFORMANCE GUARANTEE

……………………………………………………………………………………………………………………………………………
………………………… [Issuing Agency's Name and address of issuing branch or office] …………………………………….

Beneficiary: ………………………………… [Name & Address of Employer] ……………………

Date: ……………………………………………

PERFORMANCE GUARANTEE/ SECURITY NO: ……………………………………………………………………………………………

We have been informed that ………………………………………… [Name of the contractor / Supplier] (Hereinafter called "the contractor") has entered into contract NO. ……………………………………………. [Reference number of the contract] dated ……………………………………with you, for the …………………………[Insert "Construction / Supply"] of …………………………………………… [Name of contract and brief description of works or supply] (Hereinafter called "the contract")

Furthermore, we understand that, according to the conditions of the contract, a performance guarantee is required.

At the request of the contractor, we ………………………………………………[name of Agency] here by irrevocably undertake to pay you any sum or sums not exceeding in total amount of ………………………………………………………………………………………………………[Amount in figures] (……………………………………………………………………)[Amount in words]

such sum being payable in the types and proportions of currencies in which the contract price is payable, upon receipt by us of your first demand in writing accompanied by a written statement stating that the contractor is in breach of its obligations (s) under the contract, without your needing to prove or to show grounds for your demand or the sum specified therein.

This guarantee shall expire, no later than the ……………………………………………… day of ……………………………20 ………… [Insert date, 28 days beyond the schedule contract completion date] and any demand for payment under it must be received by us at this office on or before that date.

………………………………………………………………………………

[Signature (s)]

ලංසු දැන්වීම

**සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය**

## ජාතික තරඟකාරි ලංසු කැඳවීම යටතේ ක්ෂය රෝග මර් දන හා ළය රෝග පිළිබඳ ජාතික වැඩසටහන සඳහා පිරිසිදු කිරීමේ සේවය සැපයීම- 2026 /2029

2025/2026 වෂර්යක කාලයක් සඳහා ක්ෂය රෝග මර් දන හා ළය රෝග පිළිබඳ ජාතික වැඩසටහන, අධ්‍යක්ෂ යටතේ ඇති පහත සඳහන් රෝහල් හා ආයතනවල පිරිසිදු කිරීමේ සේවය සැපයීම පිණිස ලියාපදිංචි ආයතනවලින් ක්ෂය රෝග මර්දන හා ළය රෝග පිළිබඳ ජාතික වැඩසටහන, ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් ලංසු කැඳවනු ලැබේ.

**1.මෙම කොන්ත්‍රාත්තුව සඳහා පහත සඳහන් මූලික සුදුසුකම් සපුරාලිය යුතුය.**

I.ශ්‍රී ලංකාවේ ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීම් ආඥා පනත යටතේ හෝ 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ පිරිසිදු කිරීමේ සේවය සැපයීමේ ආයතනයක් ලෙස පුවත්පත් දැන්වීම පළ වූ දිනට අවම වශයෙන් වෂර්යකට පෙර ලියාපදිංචි වූ ආයතනයක් විය යුතුය.

II.පිරිසිදු කිරීමේ සේවය සැපයීම සම්බන්ධයෙන් රාජ්‍ය / අධර් රාජ්‍ය ආයතනයක හෝ පෞද්ගලික රෝහලක අවම වශයෙන් වසරක පළපුරුද්දක් තිබිය යුතු අතර, ඒ බව අදාළ ආයතනයට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කළ ලිපිය සමඟ සේවාව සැපයූ ආයතනයෙන් ලබා ගත් ලිපි සහ ගිවිසුම්වල සහතික කළ පිටපත් ඉදිරිපත් කළ යුතුය.

III. පොදු කොන්ත්‍රාත් පනතේ 08 වැනි වගන්තිය යටතේ වන ලියාපදිංචි සහතිකය(ඒ ඒ රෝහල්/ආයතනය සඳහා වෙන වෙනම ලියාපදිංචි සහතිකය ඉදිරිපත් කල යුතුය.)

IV.පහත සඳහන් එක් එක් රෝහල/ආයතන සඳහා වගුවෙහි සඳහන් වටිනාකම්වලට කොන්දේසි රහිත බැංකු අයිරා පහසුකම් ලබා දෙන බවට කොන්ත්‍රාත්කරු ගනුදෙනු කරන බැංකුවෙන් නිකුත් කළ ලිපිය (මුල් පිටපත) (කොන්ත්‍රාත්කරු විසින් රෝහල් /ආයතන කිහිපයකට මිල ගණන් ඉදිරිපත් කරනු ලබන්නේ නම් එම රෝහල්/ආයතනවල වටිනාකම්වල එකතුවට සමාන හෝ වැඩි වටිනාකමට ලබාගත් සහතිකයක් විය යුතුය.) (ලංසු විවෘත කිරීමේ දිනයට පෙර මසක් ඇතුළත ලබාගත් සහතිකයක් විය යුතුය.)

V.පූවර්ාසන්න වෂර්ය සඳහා තම ව්‍යාපාර ලියාපදිංචි නාමය යටතේ පිරිසිදු කිරීමේ සේවය සැපයීම වෙනුවෙන් සේවයේ යොදවනු ලැබූ සියළුම සේවකයින් වෙනුවෙන් සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදලට දායක මුදල් ගෙවා ඇති බවට ශ්‍රී ලංකා මහ බැංකුවෙන්/ සේවක භාරකාර අරමුදලෙන් නිකුත් කළ ලිපි/ කුවිතාන්සි / ප්‍රේෂණ නිවේදන ඇතුළත් පසුගිය වසර 03 තුළ මාස 12කට අදාළ ගෙවීම් ලේඛන ඉදිරිපත් කළ යුතුය.

VI.පූවර්ාසන්න තක්සේරු වෂර්ය සඳහා පිරිසිදු කිරීමේ ආයතනය නමින් වැට් බදු/ආදායම් බදු ගෙවා ඇති බව ලිඛිත සාක්ෂි මඟින් තහවුරු කළ යුතුය.(සී/ස සමාගමක් නම් සමාගම නමින් ද, තනි පුද්ගල /හවුල් ව්‍යාපාර ආයතන සියළු හවුල්කරුවන්ගේ නමින් ද, පූවර්ාසන්න වෂර්ය සඳහා ආදායම් බදු, වැට් බදු ගෙවා ඇති බවට ලිඛිත ලියවිලි ඉදිරිපත් කළ යුතුය. 2024 /2025 වෂර්ය සඳහා පමණි )

VII.පහත වගුවේ සඳහන් පරිදි රෝහල්/ආයතන වලට අදාළ වටිනාකමින් යුත් ලංසු ඇපකරයක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කර ඇති වාණිජ බැංකුවකින් කොළඹ 10, නාරාහේන්පිට. ඇල්විටිගල මාවත, 555/5, ලිපිනයෙහි වූ ක්ෂය රෝග මර් දන හා ළය රෝග පිළිබඳ ජාතික වැඩසටහන, අධ්‍යක්ෂ නමට ලියන ලද ලංසු භාර ගැනීම අවසන් වූ …….. දින සිට ……. දක්වා වලංගු වන සේ ලබාගත් ලංසු බැඳුම්කරයක් ලංසුව සමඟ ඉදිරිපත් කළ යුතුය.

2. ලංසු අයදුම්පත් 2026-04-06 දින සිට 2026-04-20 දින දක්වා සතියේ වැඩ කරන දිනයන්හි පෙ.ව. 9.00 සිට ප.ව.2.00 දක්වා 555/5, ඇල්විටිගල මාවත, නාරාහේන්පිට. කොළඹ 05, ලිපිනයෙහි වූ සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ (උප කායර්ාලය) ප්‍රසම්පාදන ශාඛාවෙන් ලබා ගත හැකිය. ලංසු අයදුම්පත්‍ර ලබා ගැනීම සඳහා ආපසු නොගෙවනු ලබන ගාස්තුවක් ක්ෂය රෝග මර් දන හා ළය රෝග පිළිබඳ ජාතික වැඩසටහනේ සරප් අංශය වෙත මුදලින් ගෙවා ලබාගත් ලදුපත හා ලංසු ලියවිලි ඉල්ලුම් කිරීමේ ලිපිය ඉදිරිපත් කළ යුතුය.

**ආයතනය**

| අනු අං කය | රෝහලේ නම | ප්‍රසම්පාදන අංකය | බැංකු අයිරා පහසුකම් ලබා ගත යුතු අවම වටිනාකම | ලංසු ඇපකරය (රු.) | ලංසු ලියවිලි ගාස්තුව (රු.) |
|---|---|---|---|---|---|
| 01 | ක්ෂය රෝග මර් දන හා ළය රෝග පිළිබද ජාතික වැඩසටහන | **NPTCCD/CLE/2026-2029/02** | 2,207,000.00 | 544,200.00 | 3,500.00 |

3. සම්පූණර් කරන ලද ලංසු ලියවිලි 2026-04-21 දින පෙ.ව. .10.00 ට පෙර ලැබෙන සේ සභාපති, ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව , ක්‍ෂය රෝග මර් දන හා ළයරෝග පිළිබද ජාතික වැඩසටහන, 555/5, ඇල්විටිගල මාවත, නාරාහේන්පිට. කොළඹ 05 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමට ක්‍ෂය රෝග මර් දන හා ළයරෝග පිළිබද ජාතික වැඩසටහන් කායර්ාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම හෝ භාරදීමට කටයුතු කළ යුතුය. ටෙන්ඩර් බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ “2026 /2029 වෂර්යේ සඳහා පිරිසිදු කිරීමේ සේවාව සැපයීම” යනුවෙන් සඳහන් කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

4. සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ පවත්නා රෝහල් සහ ආයතනවල පිරිසිදු කිරීමේ සේවය සැපයීම සඳහා ඉදිරිපත් කරන ලංසු එක් එක් ආයතන වෙනුවෙන් වෙන වෙනම ඉදිරිපත් කළ යුතු අතර ආයතන කිහිපයකට ලංසු ඉදිරිපත් කරන්නේ නම් ඒ සඳහා ඉදිරිපත් කරනු ලබන ලියකියවිලිවල මුල් පිටපත එක් ලංසුවක් සමඟ ඉදිරිපත් කළ යුතු වන අතර එය කුමන ලංසුවක් සමඟ ඉදිරිපත් කර ඇත්ද යන්න අනෙක් ලංසුවල පැහැදිලිව සඳහන් කළ යුතු වේ. අනෙක් ලංසු සමඟ මුල් පිටපත්වල සහතික කළ පිටපත් වෙන වෙනම ඉදිරිපත් කල යුතුය.

5. ලංසු ලියවිලි පිටපත් 02කින් මුල් පිටපත හා අනු පිටපත යනුවෙන් සඳහන් කර වෙන වෙනම කවරවල බහා එම කවර දෙක තනි කවරයක බහා ඉදිරිපත් කළ යුතුය.

6. 2026-04-21 දින පෙ.ව. 10.00 දක්වා 555/5, ඇල්විටිගල මාවත, නාරාහේන්පිට. කොළඹ 05, ක්‍ෂය රෝග මර් දන හා ළයරෝග පිළිබද ජාතික වැඩසටහන, අධ්‍යක්ෂ කායර්ාලයේ දී ලංසු භාරගැනීම සිදු කෙරේ. ලංසු භාරගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරන අතර, ලංසුකරු හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට ලංසු ලියවිලි විවෘත කිරීමේ අවස්ථාවට සහභාගී විය හැකිය. වැඩි විස්තර සඳහා අධ්‍යක්ෂ අමතන්න. (දුරකථන අංක 011-2368276 , 011 -2368275 )

7. පූවර් ලංසු රැස්වීම 2026-04-09 දින පෙ.ව 10.00 ක්‍ෂය රෝග මර් දන හා ළයරෝග පිළිබද ජාතික වැඩසටහන, 555/5, ඇල්විටිගල මාවත, නාරාහේන්පිට. කොළඹ 05 හි අධ්‍යක්ෂ කායර්ාලයේ දී පැවැත්වේ

8. ඉදිරිපත් වන ලංසු පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ප්‍රසම්පාදන කමිටුව සතු වන අතර, ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසාන තීරණය වේ.

සභාපති,

ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව ,

ප්‍රසම්පාදන අංශය,

ක්‍ෂය රෝග මර් දන හා ළයරෝග පිළිබද ජාතික වැඩසටහන,

555/5, ඇල්විටිගල මාවත,

නාරාහේන්පිට.

කොළඹ 05.

## 4.කොන්ත්‍රාත් ප්‍රදාන ලිපියේ ආකෘතිය

........................

........................

.........................

**<u>පිරිසිදු කිරිමේ සේවා සැපයීම - 2026 /2029</u>**

**<u>................................................</u>**

ඔබ ආයතනය විසින් ඉහත සේවාව සඳහා ඉදිරිපත් කරන ලද ලංසු අයදුම්පතට අනුව .....................දින සිට ..................... දින දක්වා වසරක කාලයකට ඉහත ආයතනයේ පිරිසිදු කිරීමේ සේවය සැපයීමේ කොන්ත්‍රාත්තුව ඔබ ආයතනය වෙත පැවරිමට ........................ දින රැස්වූ සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශ ප්‍රසම්පාදන" E "කමිටුව තිරණය කර ඇති බව කාරුණිකව දන්වමි.

02. ඒ අනුව පහත සඳහන් මිළගණන් යටතේ මෙම කොන්ත්‍රාත්තුව ඔබ ආයතනය වෙත පවරමි.

I. ඔබ ආයතනය විසින් දිනකට පැය 09 සේවය සඳහා පරීක්ෂකයින් ක් ද පැය 09 සේවය සඳහා කම්කරුවන් ක් ද සේවයේ යෙදවිය යුතුය.

II. නියමිත වාෂරීක වැඩ පරීක්ෂක සාමාන්‍ය අතිකාල පැය ගණන -

III. නියමිත වාෂරීක වැඩ පරීක්ෂක විශේෂ අතිකාල පැය ගණන -

IV. නියමිත වාෂරීක කම්කරු සාමාන්‍ය අතිකාල පැය ගණන -

V. නියමිත වාෂරීක කම්කරු විශේෂ අතිකාල පැය ගණන -

VI. නියමිත වැඩ පරීක්ෂකයන් සඳහා සාමාන්‍ය වාෂරීක ශ්‍රම පිරිවැය - රු.

VII. නියමිත කම්කරුවන් සඳහා සාමාන්‍ය වාෂරීක ශ්‍රම පිරිවැය - රු.

VIII. වැටුප් සඳහා වාෂරීක මුළු පිරිවැය - රු.

IX. වැඩ පරීක්ෂකයන් සඳහා සාමාන්‍ය අතිකාල පිරිවැය - රු.

X. වැඩ පරීක්ෂකයන් සඳහා විශේෂ අතිකාල පිරිවැය - රු.

XI. කම්කරුවන් සඳහා සාමාන්‍ය අතිකාල පිරිවැය - රු

XII. කම්කරුවන් සඳහා විශේෂ අතිකාල පිරිවැය - රු.

XIII. අතිකාල සඳහා වාෂරීක මුළු පිරිවැය - රු.

XIV. මුළු වාෂරීක ශ්‍රම පිරිවැය (වැට් බදු රහිත) - රු.

XV. වෙනත් පොදු කායර් සඳහා වාෂරීක පිරිවැය (වැට් බදු රහිත) - රු.

XVI.වාෂරීක මුළු පිරිවැය (වැට් බදු රහිත) - රු.

03. ප්‍රසම්පාදන තීරණ හා කොන්දේසි

I. රෝහල/ආයතනයෙහි (ලංසු ලියවිලිවල ඇමුණුම IV කොටසේ අංක 01 හි සඳහන් සේවය සැපයිය යුතු ස්ථාන) නියමිත පරිදි කම්කරු / පරීක්ෂකවරු අදාළ සේවා ස්ථානයන්හි සේවය සඳහා යෙදවිය යුතු බවත්, එය ආයතන

පරිපාලනය විසින් පරීක්ෂා කර බලා ඒ පිළිබඳව නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සැපයීම්) වෙත වාතර්ා කරන ලෙසටද,

II. පඩිපාලක සභාව විසින් අනුමත ව්‍යවස්ථාපිත වැටුප කොන්ත්‍රාත් ආයතනය මගින් නිසි පරිදි ගෙවීම් සිදුකරන්නේද යන්න පිළිබඳව අදාළ ප්‍රාදේශිය කම්කරු නිලධාරී මගින් අදාළ පියවර ගන්නා ලෙසට කම්කරු කොමසාරිස් ජනරාල් දැනුවත් කිරීමට නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සැපයීම්) විසින් කටයුතු සිදුකළ යුතු බවටද,

III. මෙම ප්‍රසම්පාදන තීරණයෙන් ලබා දෙන කොන්දේසි හා නියෝග කොන්ත්‍රාත්කරු සමඟ එළඹෙන ගිවිසුමේ කොටසක් ලෙස සැලකිය යුතු බවට හා මෙම කොන්දේසි ගිවිසුමට ඇතුලත් කරන බවටද,

IV. පොදු කායර්ය පිරිවැය සඳහා ගෙවීම් සිදුකිරීමේදී සේවක සංඛ්‍යාවේ පැමිණීමේ ප්‍රතිශතය අවම වශයෙන් 90% කට අඩුවේ නම් ලංසු කොන්දේසි අංක 8.7 අනුව කටයුතු කරන ලෙසටද ප්‍රසම්පාදන තීරණ ප්‍රකාරව දන්වමි.

(මේ සඳහා වැට් බදු රජය විසින් ගෙවිය යුතුයි.)

04. ඉහත පරිදි කොන්ත්‍රාත්තුව භාර ගැනීමට ඔබ එකඟ වන්නේ නම් වාෂර්ික කොන්ත්‍රාත් මුදලින් 10% වන රු.................. ක මුදලක් සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කර ඇති බැංකුවකින් / මූල්‍ය ආයතනයකින් / රක්ෂණ ආයතනයකින් ........................ දින සිට ..................... දක්වා කාලයකට වලංගු වන සේ සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශ ලේකම් නමින් කායර් සාධන ඇපකරයක් දින 14 ඇතුලත ඉදිරිපත් කර, ක්ෂය රෝග මර් දන හා ළය රෝග පිළිබඳ ජාතික වැඩසටහන් අධක්ෂක සමඟ සේවා ගිවිසුම අත්සන් කල යුතුය.

05. එකී කොන්ත්‍රාත්තුව, ගිවිසුම අත්සන් කරන තෙක් ලංසු අයදුම්පතේ දක්වා ඇති කොන්දේසි, මෙම කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් ව්‍යවස්ථාපිත ලිය කියවිලි ලෙස සැලකිය යුතුය.

ඉහත කොන්දේසි වලට යටත්ව මෙම කොන්ත්‍රාත්තුව භාර ගැනීමට ඔබ ආයතනය එකඟ වන්නේ නම්,මේ සමඟ අමුණා ඇති ලිපියේ අනු පිටපත අත්සන් කර මා වෙත ලැබීමට සලස්වන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

මෙයට විශ්වාසී,

…………………………….

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සැපයීම්).

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශ ලේකම් වෙනුවට.

ඉහත කොන්දේසි වලට යටත්ව උක්ත කොන්ත්‍රාත්තුව භාර ගැනීමට එකඟ වෙමි.

කොන්ත්‍රාත්තුවේ නම : .......................................................................................

දිනය ....................................... කොන්ත්‍රාත්කරුගේ අත්සන ..................................

පිටපත්

1. විගණකාධිපති, - අ.ක.ස
විගණකාධිපති දෙපාතර්මේන්තුව.

2. දේශිය ආදායම් කොමසාරිස්, - අ.ක.ස.
දේශිය ආදායම් දෙපාතර්මේන්තුව.

3. අතිරේක ලේකම් (ප්‍රසම්පාදන), - අ.ක.ස.
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය.

4. කම්කරු කොමසාරිස්,
ශ්‍රම ප්‍රමිති අංශය,
කම්කරු දෙපාතර්මේන්තුව,
කොළඹ -05.